

සමීර
පොතක්

බොරිස් ලැවරෙන්යොව්

හතළිස් එක්වැන්නා

රුසියානු ලේඛක

බොරිස් ලැවරෙන්යොව්ගේ

හතළිස් එක්වැන්නා

බොරිස් ලැව්රෙන්යොව්
හතළිස් එක්වැන්නා

අනුවාදය
© දැදිගම වී. රුදිගු

නව මුද්‍රණය - **2019**

ISBN 978-955-3993-37-3

කවර නිර්මාණය හා පරිගණක අකුරුකරණය
තිළිණි ග්‍රැෆික්ස්
අංක. 805/5A, විහාර මාවත,
තේවත්ත පාර, රාගම
☎ 0772876280

මුද්‍රණය
වින්ග්ස් ප්‍රින්ට් ෆිනිෂින් හවුස්
108, ඔබහේන පාර,
මාදිවෙල, කෝට්ටේ

ප්‍රකාශනය හා බෙදාහැරීම
සමිර ප්‍රකාශන
12, පොල්දූව, බත්තරමුල්ල
☎ 0112868249/0714856178

බොරිස් ලැවරෙන්යොව්

ගතළිස් එක්වැන්නා

කෙටි නවකතාව

අනුවාදය

දැදිගම වී. රුදිගු

සමිර

12, පොල්දූව, බත්තරමුල්ල
☎0112868249/0714856178



බොරිස් ලැවරෙන්යොව්
(1891-1959)

බොරිස් ලැවරෙන්යොව් 1981 ජුනි මස 17දා රුසියාවේ කේසන්හිදී මෙලොවට බිහිව හැට වසරක ආයු වින්දනයෙන් පසු 1959 ජනවාරි 7 දින මෙලොවින් සමුගත්තේය.

ඔහුගේ ලේඛන ජීවිතයේ තෝතැන්න වූයේ 'රෙඩ් ආමි මිලිටරි' පුවත්පතයි. ඔහු ලියූ කවි, කෙටිකතා දිගින් දිගටම පළ වීම නිසා දිරිමත් වූ ඔහු අතින් 1924දී 'හතළිස් එක්වැන්නා' කෙටි නවකතාව බිහි විය. එකල මෙම කෘතිය රුසියානු සාහිත්‍යධරයන්ගේත් පාඨක ජනයාගේත් නොමඳ ආදරය දිනා ගැනීමට සමත් විය. 1948 දී මෙයට ස්ටාලින් සම්මානය හිමි වූයේය.

මෙය 1926 දී ඉංගිරිසියට නැගීමෙන් පසු තවත් ලෝක භාෂා රැසකටම පරිවර්තනය විය. මෙය ඇසුරු කොට රුසියාවේ නිපදවුණු චිත්‍රපටයද එහි අතිශය ජනප්‍රියත්වයට පත් වූයේය.

බිහිසුණු අන්දමින් නිකුත් වූ මැෂින් තුවක්කු වෙඩි උණ්ඩ කරණකොටගෙන උතුරු කොටසේ කොසැක් යුද භටයන්ගේ කඩුගෑම මොහොතකට නතර විය. ඒ අවසරයෙන්, සිය ජීවිතය බේරාගැනීමේ අවසාන ප්‍රයත්නයක යෙදුණු රතු යෙව්සුකොප් කඩුපහර වළකමින් පැන ගත්තේය.

වැලි කතරේ සිදු වූ මේ බිහිසුණු යුද්ධයෙන් යෙව්සුකොප් සමග යුද සෙබළුන් විසිතුන් දෙනෙක්ද මර්යුට්කා නමැති කාන්තාවද අනූනවයෙන් පණ බේරාගත්හ.

යෙව්සුකොප්ගේ සේනාංකයේ ඉතිරි එකුන් විස්සද ඔටුවන් සමූහයද හිම මත වැතිර ගත්හ.

යෙව්සුකොප් හා ඉතිරි පිරිස ගැලවී ගිය බව ඇසූ කොසැක් නිලධාරි බූරිගා සිය අවුල් වූ රැවුල පිරිමැද ගුහාවක් මෙන් වූ මුඛය පළල් කොට කම්මැලි ගතියකින් මෙන්,

"යකාට ගියදෙන්, උන් පස්සේ එලවන්න එපා, කාන්තාරයෙදි උන් මැරේවි" යයි ගර්ජනා කළේය.

මේ අතර මාර මුඛයෙන් ගැලවී ගත් යෙව්සුකොප්, මර්යුට්කා හා සෙබළුන් විසිතුන්දෙනා වෙඩි කෑ හිවලුන් මෙන් ඉමක් කොනක් නැති මරු කතරේ ඈතටම දිව ගියහ.

මේ යෙව්සුකොප්ට 'රතු' යන විරුදාවලිය ලැබුණේ කෙසේ දැයි දැන ගැනීමට පාඨකයා තුළ කුතුහලයක් පහළ වනු නිසැකය.

කොල්චක්ගේ හමුදා ඔරෙන්බර්ග් දුම්රිය මධ්‍යස්ථානය අල්ලා ගැනීමෙන් පසු දුම්රිය සේවය කඩාකප්පල්වීමේ ප්‍රතිඵල වශයෙන් තුරුකිස්ථාන් සමූහාණ්ඩුවේ සම් කර්මාන්ත ශාලාවලට අවශ්‍ය සායම් වර්ග සැපයීම සම්පූර්ණයෙන් නතර විය.

මේ කාලය සම්වර්ග බෙහෙවින් අවශ්‍ය වූ යුගයකි.

උද්ගත වී තිබුණු තත්ත්වය නිසා මිනිසා ස්වභාව ධර්මයේ බලපෑම්වලට බෙහෙවින් ගොදුරු වූයෙන්, හම් ඇඳුම් විශාල වශයෙන් අවශ්‍ය විය.

සාමාන්‍යයෙන් හම් සැට්ටවලට වානේ පාට කවන ලදී. එහෙත් ඉහත සඳහන් සිද්ධියෙන් අනතුරුව තුර්කිස්ථානයට මේ වර්ණවත් සායම් වර්ගය ලැබුණේ නැත.

එම නිසා ජර්මනියෙන් ලැබුණු නානා වර්ණවලින් යුත් සායම් වර්ග කවන ලද හම් ඇඳුම් රතු හමුදාවට ලැබී තිබුණි.

යෙව්සුකොප්ට ලැබී තිබුණේ රතු පැහැති හම් ඇඳුම් කට්ටලයකි.

කුඩා කල පටන් පැල්ලම් සහිත රතු පැහැති මුහුණකින් යුත් යෙව්සුකොප් මිටි තරබාරු පුද්ගලයෙකි. රක්ත වර්ණ හම් ඇඳුම් කට්ටලයෙන් සැදුණු ඔහු ජනේරු බිත්තරයක ස්වරූපය ගත් නමුත් යෙව්සුකොප් ජනේරු ගැන හෝ ක්‍රිස්තුස් වහන්සේ ගැන හෝ මඳකුදු විශ්වාසයක් තැබූවෙක් නොවේ. ඔහුගේ විශ්වාසය සෝවියට් සභා කෙරෙහි, අන්තර් ජාතිකය කෙරෙහි, චෙකා මණ්ඩලය කෙරෙහි සහ ඔහුගේ හැඩිදැඩි මිටින් ගත් රිවෝල්වරය කෙරෙහි පමණක් රැඳී තිබුණි.

මොහු සමග මාර වළල්ලෙන් පැනගත් ඉතිරි විසිතුන්දෙනා රතු හමුදා සේනාංකයක සාමාන්‍ය භටයෝය.

ඔවුන් අතරේ මර්යුට්කා නම් සුරූපී තරුණියද වූවාය.

මර්යුට්කා අස්ට්‍රකානය අසල වොල්ගා ඩෙල්ටාවේ පිහිටි ධීවර ග්‍රාමයකින් පැමිණි ධීවර කෙල්ලකි. හත් අවුරුදු වියේදී ජීවිතයට පා තැබූ මර්යුට්කා, දොළොස් වසක් තිස්සේ දෙකකුල් දෙපසට දමා හිඳගෙන, කුඩා කොළොම්බුවක මාළු වරල්, කන්තොලු යනාදියට මැදි වී හුරුල්ලන්ගේ බඩ බොකු ඇදීමේ නියුක්ත වී සිටියාය.

එකල රතු මුර කණ්ඩායම් වෙනුවෙන් හඳුන්වනු ලැබූ හමුදාවට ස්වෙච්ඡා භටයන් බඳවා ගැනීමේ ආරංචිය ගෙයක් දොරක් පාසා පැතිර ගියෙන්, එය දෙසවන් පතිත වූ ඇසිල්ලේ තම සුරතෙහි රැඳී තිබුණු හුරුල්ලන්ගේ ලේ වැකුණු පිහිය හිඳ සිටි කොළොම්බුවේ ඇන, නැගිට සිටි මර්යුට්කා, මාළු පිලි තැවරුණු කැන්වස් කලිසම පිටින්ම මුර කණ්ඩායමට බැඳීමේ අපේක්ෂාවෙන් දිව ගියාය.

පළමුවෙන් කාර්යාලයේ සිටි නිලධාරීහු ඈ පලවා හළ නමුත් ඈ දිනපතා කාර්යාලයට පැමිණ වදකරන්නට වූයෙන් අවසානයේ දී ඇගේ ඉල්ලීමට එකඟ වී පිරිමින්ට සමාන භටයකු ලෙස ඈ බඳවා ගත්හ.

ගඟබඩ වැවෙන පන් බඩයක් මෙන් සුකොමළ වූ මර්යුට්කා කොට්ටම්බා ගොඩිවල හැඩයට සමාන දෙඇසකින් යුක්ත වූවාය. එහි බළල් ඇස්වල කාන්තිය දක්නට තිබුණි. ටර්ක්මේනියානු හිස් වැස්මක් පලඳින ඈ හිසකේ ගොතා පිටුපසට බැඳීමට පුරුදු වූවාය.

මර්යුට්කාගේ මුළු ජීවිතයේ එකම පරමාර්ථය සිහින මැවීමය.දවල් හීන දකින ඈ කවි රචනය ප්‍රිය කළාය. පැන්සල් කැබැල්ලක් සොයා ගන්නා ඈ අතට අසු වන සෑම කඩදාසි කැබැල්ලකම කවි ලිවීම පුරුද්දක් කරගෙන සිටියාය.

එය මුළු සේනාංකයම දැන සිටි කරුණකි.

පුවත්පතක් පළ වන නගරයකට මේ සේනාංකය පිවිසි වහා කෙසේ නමුත් පැන්සලයක් හා කඩදාසි සොයා ගන්නා මර්යුට්කා දෙතොල් වියළී යන තලබලයෙන් සහ ඉතා උනන්දුවෙන් 'කවි' ලියා, "මාරියා බසෝවා විසිනි" යි සඳහන් කොට පුවත්පත් කාර්යාලය වෙත ගෙන යන්නීය.

සම් ඇඳුම් කට්ටලයෙන් සැරසී, රයිපලයක් උරිස්තල එල්ලාගෙන පැමිණෙන මේ සෙබළ තරුණිය දකින කර්තෘවරු ඇගේ කවි පන්තිය කියවා බැලීමට පොරොන්දු වන අතර කාර්යාලයේ සිටින හැම කෙනකු වෙතම උපශාන්ත මන්දස්මිතයකින් සංග්‍රහ කරන ඈ බලාපොරොත්තු සහගතව පිටව යන්නීය.

එම කවි පන්තිය කියවීම ආරම්භ කරන කර්තෘවරයා පේළි කිහිපයක් ඔස්සේ ඇස් යවා දෙවුර හකුලාගෙන මහ හඬින් සිනාසෙන්නට පටන් ගනී. ඒ හඬ අසන සෙසු කර්තෘවරුද ඔහු වටා රැස් වී විනෝදයෙන් මුව අයාගෙන සිටින අතර කතුතුමා මර්යුට්කාගේ කවි පන්තිය කියවමින් තව තවත් විනෝද වන්නේය.

පසුදා උදෑසන යළි පුවත්පත් කාර්යාලයට පැමිණෙන මර්යුට්කා කතුතුමාගේ මුකුලිත වූ මුහුණ දෙස තීරණාත්මක බැල්මක් හෙළා තම කවි පන්තිය ලබාගෙන සිහින් හඬෙකින් මෙසේ කියන්නීය.

"හොඳ නැහැ නේද? අවසානයක් නැහැ නේද? පොරවකින් දර පළන්නා වාගේ මා ඒවා මගේ හදවතින් පළාගත්තා, නමුත් ඒවා හොඳ නැහැ. මා හිතනවා තවත් මහන්සි වෙන්නට ඕනෑ වෙයි කියා. කරන්න දෙයක් නැහැ. කවි ලියන්න ඔය තරම් අමාරු මොකද? හත්ඉලව්වයි!"

උරිස් හකුළුවාගෙන ටර්ක්මේනියන් තොප්පිය සකස් කොටගෙන මර්යුට්කා කාර්යාලයෙන් පිටවන්නීය.

කාව්‍යකරණයෙහි මර්යුට්කා දක්ෂ නොවූවද ඈ දක්ෂ ඉලක්කකාරියකි. මුළු සේනාංකයේම දක්ෂ වෙඩික්කාරිය වූ ඈ සටනකදී නිතරම යෙව්සුකොප් අසල සිටියාය.

ඔහු ඇඟිල්ල එල්ල කර,

"අන්න, මර්යුට්කා, නිලධාරියෙක්!" කී විගස ඈ ඇස් කරකවා, දෙතොල් ලෙවකා, සෝමාරිකමින් තුවක්කුව එල්ල කරන්නීය. ඒ ඉලක්කය නොවරදින්නේය.

වෙඩි තැබීමෙන් පසු හෙමිහිට තුවක්කුව පහත හෙළන මර්යුට්කා, "තිස් නවයයි. හත්ඉලව්වයි!.... හතළිහයි, හත්ඉලව්වයි!" යනුවෙන් කියන්නීය.

"හත්ඉලව්ව" ඇගේ මුඛ පාඨයයි. වෙනත් කැත වචන අප්‍රිය කරන ඈ, සෙසු භටයකු අප්‍රිය වචනයක් කියනු ඇසුණු විට රවා බලන්නීය.

සේනාංකයට අභිනවයෙන් බැඳුණු ගුසා නමැති මැග්යාර් ජාතික තරුණයෙක් ඈ කෙරෙහි නොමනා බලාපොරොත්තුවකින් පෙළෙන්නට විය. එක්තරා රාත්‍රියක ඔහු කල් යල් බලා මර්ට්යුකා වැතිර සිටින තැනට බඩ ගෑවේය. අවසාන ප්‍රතිඵලය භයානක විය. මැග්යාර් තරුණයා පෙරළා ගියේ ඉදිරි දත් තුනක් අහිමි වී, නළල ගෙඩි නංවාගෙනය. මර්යුට්කා තම රිවොල්වර් මිටින් ඔහු පිළිගත්තාය.

ඈ එල්ලයට තබා භටයෝ අහිංසක විහිළු තහළු කරන නමුත් යුදබිම් වැදුණු ඇසිල්ලකින් ඔවුහු ඔවුන්ගේ දිවි දෙවැනි කොට ඇය පරෙස්සම් කළහ. මේ වූ කලී දළ හම් කඩකින් කළ සැට්ටයෙන් වැසුණු ඔවුන්ගේ හදවත තුළ මුල් බැස තිබුණු මෘදු හැඟීමක ප්‍රතිඵලයයි.

ඉමක් කොනක් නොවූ ශීතලෙන් මිදී ගිය මරු කතරේ වැදී ගත් යෙව්සුකොප්, මර්යුට්කා හා ඉතිරි විසිතුන් දෙනා පිළිබඳ තොරතුරුය මේ.

ඒ පෙබරවාරි මාසයයි. වැලි කඳු අසල සෑම බිම් අඟලක්ම හිම කලාලයෙන් වැසී ගියේය. අන්ධකාරාභිමුඛව අරමුණක් නැතිව පිය නගන මේ පිරිසට ඉහළින් හමන මාරුතය අඛණ්ඩ වූ අතර ඇතැම් විටෙක වෙඩි උණ්ඩද ගමන් කළේය.

ඒ වූ කලී දුෂ්කර ගමනකි. ඔවුන්ගේ මලානික වූ පා හිම හා වැලි අතර කිඳා බැස්සේය. මාරුතයෙන් අහසට නැගී ගත් සිනිඳු වැලි සූර්ය රශ්මියට හසු වූ පුපුරු මෙන් දිලිසෙන්නට විය. පිහියකින් කපන ලද ඉරක් මෙන් සෑම පැත්තකින්ම දක්නට ලැබුණු ක්ෂිතිජය නිසා සකල ලෝකයෙන්ම තුරන් වූ බවක් පළ විය.

ඇත්ත වශයෙන්ම මේ පරිච්ඡේදය මා කියන්නට අදහස් කරන කතාවේ අප්‍රධාන සුළු කොටසකි. මීට වඩා ලෙහෙසියෙන් කෙළින්ම කතාව ආරම්භ කරන්නට තිබුණි. එහෙත් කාරාකුම්හි සිට වර්ස්ට් තිස් හතක් වයඹ දිගට පැමිණි මේ ගුර්යිව් සේනාංකය කොතැනක සිට පැමිණියේද? ඔවුන් අතර කෙල්ලක් සිටින්නේ මන්ද? කොමිසාර් යෙව්සුකොප්ගේ ශරීරය රක්ත වර්ණයෙන් යුක්ත වූයේ මන්ද? යනාදී කරුණු පාඨකයා විසින් දත යුතුය.

මේ පරිච්ඡේදය ලියන ලද්දේ එය සඳහන් කළ යුතු බැවිනි.

ඈත ක්ෂිතිජයේ කළු සලකුණක් පහළ වෙයි.
ළංවී බලන විට එය ගොවිරුකාඕට්‍රොක්
ආරක්ෂක හමුදාංකයේ ලෙප්ටිනන්ට් කෙනෙකි.

ජාන් - ගෙල්ඩ් ක්ෂේම භූමියේ සිට සොයි - කුඩුක් ක්ෂේම භූමියට දුර වර්ස්ට් හැත්තෑවෙකි. එතැන් සිට උෂ්කාන් ජලාශයට වර්ස්ට් හැට දෙකක් තිබේ.

"නවතිනු! කඳවුරු බඳිනු!"

ගස් මුල් රැසක් දෙස ඈත දිගු කළ යෙව්සුකොප් ශීතල ස්වරයකින් අණ දුන්නේය.

දිරා ගිය මුල් එකතු කොට ඔවුහු ගිනිමැලයක් ගැසූහ. දැළි සහිත මලානික ගිනි දැල් නිකුත් වූ ඒ ගිනි මැලය වටා වැලි මත තෙතමනයක් පැතිර ගියේය.

තම තමන්ගේ මලුවලින් එළියට ගත් හාල් හා මස් පිසීමට ගිනිමැලය වටා හිඳගත් සොල්දාදුවෝ පටන් ගත්හ. ස්වල්ප වේලාවකින් එළුමස් පිසෙන සුවඳ අවට පැතිර ගියේය.

ශීතල සුළඟේ දැඩි හස්තයෙන් මිදීම සඳහා, 'කිටි - කිටි' යන අනුකරණයෙන් ගැහෙන දත්වලින් නික්මෙන හඬින් පෙළෙන්නට වූ ඔවුහු එකිනෙකාට තුරුලු වී ගිනි මැලය වටා රොක් වූහ. ගින්දරට ඉතා ළංවීම නිසා ඔවුන්ගේ පාවහන්වලින් වාෂ්ප පිට වෙන ශබ්දය පවා ඇසෙන්නට විය.

ශීතලෙන් සුදුමැලි වූ වාතය ඔස්සේ ඔටුවන් කර බැඳි ගෙජ්ජී හඬ ඈත අවකාශයේ පැතිර ගියේය.

ශීතලෙන් ගැහෙන අත්ල මත තබමින් යෙව්සුකොප් දුම්වැටියක් ඔතන්නට විය.

"සහෝදරවරුනි, මෙතැනින් යා යුතු තැන තීරණය කරන්නට ඕනෑ"

දුම් ගුළියක් පිට කළ ඔහු අමාරුවෙන් පළ කළේය.

"කොහාටද යන්න පුළුවන්?"

ගිනි මැළයෙන් අනෙක් පැත්තේ සිටි කෙනෙක් අප්‍රාණික ස්වරයකින් විමසුවේය.

"කොහාට ගියත් එකයි! සියල්ල පැහැදිලියි. අපට ගුර්යිව් නගරයට යන්නට බැහැ. කොසැක්වරු එහි ඉන්නවා. ගුර්යිව් හැරුණු විට යන්නට වෙන තැනක් නැහැ!"

"ඇයි?"

"ඇයි කීවා! මේ ගැහෙන ශීතලේ කාරාකුම් හරහා වර්ස්ට්ස් හයසීයක් දුර? අපි කන්නේ මොනවද?"

සියල්ලෝම මහා හඬින් සිනාසෙන්නට වූහ.

"හැම දෙයක්ම පැහැදිලියි. අපි සුං."

යළිත් කලින් පළ වූ අප්‍රාණික කටහඬ නිකුත් විය.

යෙව්සුකොප්ගේ හදවත හැකිලී ගිය නමුත් ඔහු ඒ බවක් පළ කළේ නැත.

"කාලකණ්ණි කරදරකාරයා, අපි සුං වෙන්න තව බොහෝ කල් තියෙනවා. ඕනෑ මෝඩයකුට මැරෙන්න පුළුවනි!"

යෙව්සුකොප් කෝපයෙන් කීය.

"අපට ඇලෙක්සැන්ඩ්‍රොව්ස්කි කොටුවට යාගන්නට පුළුවනි. එහි ඉන්නෙත් අපේ ජනයා. මස් මරන්නෝ"

"හරියන්නෙ නැහැ. ඩෙනිකින් එහි ඇවිත් ඉන්න වග ආරංචියි. ඇලෙක්සැන්ඩ්‍රොව්ස්කි හා ක්‍රස්නොවුඩ්ස්ක්වල වයිට්ගාඩ්වරු."

නිදාගෙන සිටි එකෙක් ගොරවන්නට විය.

යෙව්සුකොප් ඔහුගේ දණහිසට පහරක් ගැසුවේය.

"කංකෙඳිරිය ඇති, යන්නට පුළුවන් එකම තැනටයි. ඇරල් මුහුද. ඇරල් මුහුද වෙරළට ගොහින්, කසලින්ස්ක් නගරයට යමු, කසලින්ස්ක් නගරයේ හමුදා මූලස්ථානයක් තිබෙනවා. එහි යාම හරියට ගෙදර ගියා වගෙයි." යෙව්සුකොප් යෝජනා කළේය.

ඔහු නිශ්ශබ්ද විය. යෙව්සුකොප් පවා එය කළ හැකි යැයි විශ්වාස කළේ නැත.

"අපි මගදී කන්නේ මොනවාද?"

"පටි තදකර ගන්න වෙයි! අපි කුමාරවරුන් නොවෙයි. හරක් මස් මීපැණිවලට විතරද කැමැති? ඒවා නම් ලැබෙන එකක් නැහැ. තව හාල් ටිකක්, පිටි ටිකක් ඉතිරි වී ඇති." යෙව්සුකොප් තරහෙන් මෙන් පැවසීය.

"ඒවා තව තුන් දිනකට ඇති."

"ඇයි? ඉතින් මන්ද? එර්නිස් බොක්කට යන්න දහ දිනක් ගතවේවි. අපට ඔටුවන් හය දෙනෙක් ඉන්නවා. තියෙන දේවල් කාලා ඉවර නම් උන් මරාගෙන කනවා! දැන් උන්ගෙන් අපට ප්‍රයෝජනයක් නැහැ. කොහොමහරි එහාට යන්න ඕනෑ."

කිසිවෙක් කිසිවක් පළ කළේ නැත. ගිනිමැලය අසල හිස දෙඅත හොවා ගෙන සිටි මර්යුට්කා, සිය බළල් ඇස්වලින් හිස් බැල්මෙන් යුක්තව ගිනිදැල් වෙත බලාගෙන සිටියාය. හදිසියේම යෙව්සුකොප් නැගිට තම කබායේ රැඳී තිබුණු හිම පිස දැමුවේය.

"ඒකත් එහෙමයි, ඉර පායන විට නැගිට ගමන් කළ යුතුයි. සමහර විට අපට එහි යන්නට බැරිවෙන්නට පුළුවනි. නමුත් විප්ලවය නිසා උත්සාහ කළ යුතුයි. විප්ලවය, ලෝක කම්කරුවන්ගේ නාමයෙන්."

කලබලයට පත් කුරුල්ලකු මෙන් යෙව්සුකොප් පළ කළේය.

තමා අවට සිටි විසිතුන් දෙනා දෙස යෙව්සුකොප් විමසිල්ලෙන් බැලුවේය. ඒ ඇස්වල වෙනදා ඔහු දුටු කාන්තිය අද ඔහු නොදකියි! ඔවුන්ගේ බැල්ම හිස්ය. සැකය උමතුව, අඩවන් වූ ඇස්වලින් එළියට පනින්නට මෙන් නෙරා තිබුණි.

"පළමුවෙන් ඔටුවන් මරා කාලා ඊට පස්සේ එකිනෙකා මරාගෙන කමු!"

එක්කෙනෙක් තොල මතුළේය.

නිශ්ශබ්දය පැතිර යන්නට විය.

උමතුවෙන් මෙන් හදිසියේම යෙව්සුකොප් ගුගුළේය.

"කටවහනු! නුඹලාගේ විප්ලවකාරී සේවය අමතක වෙලාද? නිශ්ශබ්ද වව්! අණ අණ බව දැනගනිව්! නිශ්ශබ්ද නූනොත් බිත්තියට හේත්තු කරනවා!" කහින්නට වූ ඔහු හිඳ ගත්තේය.

බත්හැළිය හැඳිගාමින් සිටි සෙබළා සුළඟට කතා කළේය.

"ඔය කන්දොස්කිරියාව නවතලා කෑම කාපල්ලා! මා මෙතන දාඩිය පෙරාගත්තේ මොකටදැයි හිතනවාද?"

ශීතලවීමට පෙර උණුඋණුවෙම බත් පිඬු මුඛය තුළ රුවාගත් භටයෝ තලුමරන්නට වූහ.

ගිනි මැලය නිවෙන්නට විය. වඩවඩාත් ළං වූ භටයෝ ඔවුනොවුනට තුරුලුව නිදන්නට වැටුණහ.

යෙව්සුකොප් අවදිවන විට හිරු උදා වී තිබුණි. එකට ඇලී තිබුණු ඇසිපිය අමාරුවෙන් විවෘත කළ ඔහු විඩාවෙන්, ළඟ තිබුණු රයිපලය අතට ගත්තේය.

"ඉවසපන් පපුව!"

ඔහු වෙත නැඹුරු වී සිටි මර්යුට්කාගේ බළල් ඇස්වල කාන්තිය ඔහු දුටුවේ ය.

"මොකද?"

"නැගිටින්න කොමිසාර් සහෝදරයා. ඔබ නිදා සිටි අතර මා ඔටුවකු පිට නැගී සවාරියක් ගියා. ඩිජාන් - ගෙල්ඩි සිට එන කිර්ගිස් තවලමක් දුටුවා!"

යෙව්සුකොප් අනෙක් අතට හැරුණේ ය.

"තවලමක්? හීනයක් නොවෙයි නේද?" විමතියට පත් යෙව්සුකොප් ප්‍රශ්න කළේය.

"හත්ඉලව්වයි. සහතික ඇත්ත! ඔටුවන් හතළිස් දෙනෙක්."

ක්ෂණයකින් නැගිට සිටි යෙව්සුකොප් හුරුහම් බාන්නට විය.

පිබිදුණු විසිතුන් දෙනාම ශීතලෙන් මිරිකී ගිය අඟපසඟ වසඟකර ගැනීම දුෂ්කර වුවද, තවලම ගැන ඇසූ වහා ඔව්හු ප්‍රාණවත් වූහ.

එහෙත් නැගිට සිටියේ විසිදෙනෙකු පමණකි. අශ්වයකුගේ ඇඳුමක් පොරවාගෙන සිටි විසිතුන්වැන්නාගේ සිරුර උස් පහත් වෙමින් තිබුණි.

ඔහුගේ කමිස කර යටට ඇඟිල්ලක් යවා පරීක්ෂා කළ මර්යුට්කා.

"අමාරුයි" කීවාය.

"කපෝතියි! අපි මොකද කරන්නේ? තව බ්ලැන්කටුවක් පොරවා ඉන්න හරින්න. මෙයා එක්ක යන්න ආපසු එමු. තවලම පෙනුණේ කොහේද?"

මර්යුට්කා බටහිර දිසාවට අත දිගු කළාය.

"වැඩිය දුර නැහැ. වර්ස්ට් හයක් පමණ. බර ලොකු බඩු මිටි."

"මරු! සහෝදරවරුනි, පැනල යන්න නම් දෙන්න එපා. දුටු වහාම වටකරගන්න ඕනෑ. මහන්සි වෙන්න එපා. වමට බාගයයි.දකුණට බාගයයි. යමු."

තවලම ගැන ඇසීමෙන් ප්‍රාණවත් වූ ඔව්හු යුහුසුළුව කණ්ඩායම් දෙකකට බෙදී තවලම වටලන අදහසින්, වැලි කඳු අතරින් නැමි නැමී, එදෙසට ගමන් කරන්නට වූහ.

අත්ලක තබන ලද කළු පබළු පන්තියක් මෙන් හිම මත ගමන් කරන ඔටුවන් සමූහය, කඳු ගැටයකට නැග ගත් ඔවුන්ගේ ඇසට හමු විය.

"මේක නම් දෙවියන්ගෙන් ලැබුණු තෑග්ගක්. දෙවියො අපට අනුකම්පා කරලා!" ග්වොඩියොප් කෙඳිරි ගෑවේය.

"කෙහෙල්මල, දෙවියො නැති බව කී වතාවක් කියල තියෙනවද?" හැම දෙයක්ම සිදුවන්නේ භෞතික විද්‍යාව අනුවයි."

යෙව්සුකොප් මොර දුන්නේය.

තර්ක කිරීමට වේලාවක් නොවීය. සැඟ වී ගත හැකි හැමදෙයක්ම උපයෝගී කොට ගෙන තවලම දෙසට ළං වෙන ලෙස නියෝගය ලැබුණි. ඔවුන්ගේ ඇඟිලි වේදනා වෙන තරම් තදින් ඔව්හු සිය රයිපල් මිටින් ගත්හ. තවලම ගැළවී ගියහොත් ඒ සමගම ඔවුන්ගේ ජීවිතය, ඔවුන්ගේ ගැලවීම, ඔවුන්ගේ බලාපොරොත්තු යන සියල්ල පළායන බව ඔව්හු දැන සිටියාහ.

"කම්මැලි ගතියෙන් තවලම්කරුවෝ පිය නැගුහ. ඔටුවන්ගේ පිට උඩ පටවා තිබුණු දිලිසෙන හම් බෑග් සහ ඔටුවන් අසලින් මිනිසුන්ද හොඳින් පෙනෙන තෙක්මානයට සෙබළ මුළ ළං වූහ.

වැලි කඳු මුදුනකට නැග ගත් යෙව්සුකොප් රයිපලය එල්ලකොට, මහා හඬින් මොර දුන්නේය.

"ටොක්ටා! තුවක්කු තිබේ නම් වහා බිම තබනු. බොරු එපා. නැත්නම් උඹලා සුං"

යෙව්සුකොප්ගේ වේගවත් හඬ කණ වකුණු ක්ෂණයෙහි පසුබා ගිය ඔටු පාලකයෝ බිම වැතිර ගත්හ.

දිවීමෙන් විඩාවට පත්ව සිටි රතු හමුදා භටයෝ හැම පැත්තෙකින්ම තවලම කරා දිව එන්නට වූහ.

"ඔටුවන් ගනිව්"

යෙව්සුකොප් අණ දුන්නේය.

එහෙත් තවලම කෙරෙන් නිකුත් වූ රයිපල් වෙඩි හඬින් ඔහුගේ අණදීම යටපත් විය. රයිපල් වෙඩි උණ්ඩ ගුවන දෙවනත් කරමින් දිව ගිය අතර යෙව්සුකොප් අසල සිටි එකෙක් දෑත් විදහාගෙන හිටිමත ඇදවැටුණි.

"පාත්වෙනු, යකාට ගියදෙන්" වැලි කන්දකට මුවාවෙමින් යෙව්සුකොප් කීය.

තවත් වෙඩි මුරයක් අහස ගිගුම් දෙමින් නිකුත් විය.

හුරුපුරුදු වෙඩික්කාරයන් වූ කිර්ගීස්වරු හිඳුවන ලද ඔටුවන් පිටුපසට වී වෙඩි තැබූහ. එහෙත් ක්‍රමක්‍රමයෙන් වෙඩි තැබීම දුර්වල විය.

මේ අතර කඩින්කඩ දිව ගිය රතු හමුදා භටයෝ තවලමට පියවර තිහකින් පමණ ළං වූහ. යෙව්සුකොප්, ඔටුවකුගේ කඳින් එහා පැත්තේ උස් වූ ලොම් හිස් වැසුමක් පැලඳ සිටියකුගේ හිසක් දුටුවේ ය. ටිකෙන් ටික උස් වූ ඒ තැනැත්තාගේ උරිස මත රත්‍රං පටියක් තිබුණි.

"මර්යුට්කා, අන්න සතුරෙක්!"

තමා අසලින්ම බඩගාමින් ඉදිරියට ඇදෙන මර්යුට්කා දෙසට හැරුණු යෙව්සුකොප් කීවේය.

"මට පේනවා"

ඈ හෙමිහිට එල්ලය බැලුවේය. ඇගේ රයිපලයේ කොකා ගැස්සුණා පමණකි.

සමහර විට ඇඟිලි හිරිවැටී තිබෙන්නට ඇත. සමහර විට දීවීමෙන් හෝ විමතියෙන් ඈ මුසපත් වී ඇත. ගැස්සෙන්න ඇත. හේතුව කුමක් වුවත් ඈ, "හතළිස් එකයි හත්තිලව්වයි" කියනවාත් සමගම සුදුහිස් වැස්මෙන් හා නිල් කබායෙන් සැරසී සිටි මිනිසා ඔටුවාට පිටුපසින් නැගිට සිය රයිපලය උස්සා යටත් වූ බව පළ කළේය. රයිපලය අග තිබුණු බයිනෙත්තුවේ සුදු ලේන්සුවක් ලෙළ දුන්නේය.

වැලිමත සිය තුවක්කුව දැමූ මර්යුට්කා, කඳුළු සලමින් හඬන්නට වූවාය.

යෙව්සුකොප් නිලධාරියා වෙත පැන්නේය. එහෙත් ඔහු පසුකරමින් දිව ගිය භටයෙක් තම රයිපලයට බයිනෙත්තුව සවි කර එය ඔහුගෙ සිරුර තුළට යැවීමට සැරසුණි.

"නවතිනු! නොමරා අල්ලනු!"

යෙව්සුකොප් මොරදුන්නේය.

නිල් කබාය ඇඳ සිටි මිනිසා අල්ලා බිම දමන ලදී. ඔහු සමග සිටි තවත් පස් දෙනෙක් ඔටුවන් අසල මැරී සිටියහ.

සිනාවෙමින් වහසි බස් බෙණෙමින් එතැනට රොක් වූ රතු සෙබළු ඔටුවන් එක්තැන් කරන්නට වූහ.

යෙව්සුකොප් වෙත, සුනඛ පෝතකයන් මෙන් බැගෑපත් ලීලාවකින් ළං වූ කිර්ගීස් ඔටු පාලකයන් වෙත ඔහු රිවෝල්වරය එල්ල කෙරෙමින්, රොස් පරොස් ලෙස කතා කළ නමුත් ඔහු තුළ ඔවුන් ගැන අනුකම්පාවක් හට ගත්තේය.

"ටොක්ටා, අහකට වෙනු, අණ අණමයි"

වටිනා පිළියෙන් සැරසී සිටි, සුදු රැවුලකින් යුත් එක් කර්ගීසියෙක් යෙව්සුකොප්ගේ පටියෙන් අල්ලා ගත්තේය.

"උයි, බායි, බායි ඔටුවන් ගන්න? බොහොම නරකයි. අපි ජීවත් වෙන්නෙ ඔටුවන්ගෙන්. ඔටුවන් නැත්නම්, අප මැරෙනවා. ඔටුවන් ගෙනයන්න එපා. බායි, සල්ලි ඕනෑද? මෙන්න සල්ලි. රිදී සල්ලි - සාර් සල්ලි - කඩදාසි සල්ලි - කෙරන්ස්කි සල්ලි - කොපමණ ඕනෑද? ඔටුවන් නම් ගන්න එපා."

ඔහු වෙව්ලමින් අයැදීය.

"මොකද හාදයො උඹට පේන්නෙ නැද්ද? ඔටුවන් නැත්නම් අපි මැරෙනවා. මා මුන් හොරකම් කරන්නෙ නැහැ. මා මුන් අරගෙන යන්නෙ විප්ලවයෙ නාමයෙන්, අණ අණමයි. තාවකාලිකයි. උඹලාට නම් මෙතැන සිට ආපසු ගෙදරට යන්න පුළුවනි, අපට මුන් නැති වුණොත් මරණෙ."

"උයි, බායි, බොහොම නරකයි. සල්ලි ගන්න."

කිර්ගීස් ජාතිකයා යාඥා කළ නමුත් යෙව්සුකොප් ඔහු පසෙකට තල්ලු කළේය.

"මා උඹට කිව්වා, වැඩි කතා නැහැ. මෙන්න මේ තුංඩුව අරගෙන පලයං යන්න."

යෙව්සුකොප් කිර්ගීස් ජාතිකයාට යමක් ලියන ලද කඩදාසි කැබැල්ලක් දුන්නේය.

කිර්ගීස් ජාතිකයා එය විසිකළේය. ඔහු වටා සිටි ඔහුගේ අනුගාමිකයෝ නිශ්ශබ්දව බලා සිටියහ.

යෙව්සුකොප් ආපසු හැරී අත්අඩංගුවට ගනු ලැබූ නිලධාරියා දෙස බැලුවේය. රතු සෙබළුන් දෙදෙනකු අතර සිටි ඔහු සිගරැට්ටුවක් උරමින් සිටියේය.

"ඔබ කවුද?"

යෙව්සුකොප් ඇසී ය.

"ගොවුරුකා - ඔට්‍රොක් ආරක්ෂක හමුදාවේ ලෙප්ටිනන්ට්! ඔබ කවුද?

දුම් ගුළියක් පිට කළ නිලධාරියා ප්‍රශ්න කළේය.

ඔහු හිස එසෙව්වේය. හිම මෙන් සුදු, සුදු ඉංගිරියාවේ මැද පිහිටි අතිශයින් නීලවර්ණ වූ ඔහුගේ කාන්තිමත් ඇස්, යෙව්සුකොප් ඇතුළු රතු හමුදා කණ්ඩායම මවිතයට පත් කිරීමට සමත් විය.

කොළොම්බස්ගේ පිරිස ලැබූ අත්දැකීම්වලින් ලත් හැඟීම්වලට සමාන හැඟීම්වලින් පීඩිතව, ඔවුවන් නොමැතිව පයින්ම මධ්‍යම ආසියාවේ කාන්තාරයක ගමන් කරද්දී ලත් දුෂ්කරතා සම්බන්ධවයි.

ලෙප්ටිනන්ට ගොවොරුකා - ඔට්‍රොක්, මර්යුටිකාගේ හතළිස් එක්වැන්නා විය යුතු ව තිබුණි. එහෙත් ඇගේ අත් සීතලෙන් ගැහෙමින් තිබුණ නිසා හෝ, ඈ කලබලවීම නිසා හෝ ඇගේ ඉලක්කය වැරදී ගියේය.

එබැවින් ලෙප්ටිනන්ට්ගේ ජීවිතය බේරුණු අතර, ජීවත් වන්නන්ගේ සංඛ්‍යාවට තවත් එකෙක් එකතු විය.

යෙව්සුකොප්ගේ අණ පරිදි සිරකරු පරීක්ෂා කරන ලදින් ඔහුගේ අලංකාර කබාය පසුපස රහස් පේටකයක් තිබී සොයා ගැනීමට හැකි විය.

ඒ පේටකයට රතු හටයාගේ අත ගිය ක්ෂණයෙහි ලෙප්ටිනන්ට් වල් අශ්වයකු ලෙස දඟලන්නට විය. පසුව ඔහු මැඩපවත්වන ලද නමුත්, ඔහුගේ සැලෙන දෙතොලින්, මුහුණේ මතු වූ සුදුමැලි ගතියෙන් ඔහු තුළ පහළ වූ හැඟීම් කෙබඳු වී දැයි හෙළි විය.

සාක්කුවේ තිබී සොයා ගත් කුඩා පසුම්බිය විවෘත කළ යෙව්සුකොප්ගේ ඇස් ඒ තුළ තිබුණ ලියවිල්ලක ඇලී ගියේය. එය පරික්ෂාකාරී ලෙස කියවූ ඔහු හිස සලා තදින් කල්පනා කරන්නට විය.

ඒ සංදේශය රැගෙන එන ලෙප්ටිනන්ට් ගොවොරුකා ඔට්‍රොක් වාඩිම් නිකොලයෙවික්, ජෙනරල් ඩෙනිකින්ගේ

නායකත්වයෙන් පිහිටුවා තිබෙන ට්‍රාන්ස් කැස්පියන් රජයේ, පෙනී සිටිය යුතුයැයි රුසියාවේ අද්විතීය පාලකයාණන් වූ ඇඩ්මිරල් කොල්චක්ගේ ආණ්ඩුව තීරණය කර තිබෙන බව එහි සඳහන් විය. සන්දේශය හා තිබුණ තවත් ලියමනක ජෙනරාල් ඩ්‍රව්සෙන්කෝ වෙත කටින් කිය යුතු පණිවුඩයක්ද මොහු රැගෙන එන බව පළ වී තිබුණි.

තිබුණු පරිදි එම සංදේශය හකුලා තමාගේ කබායේ යටි සාක්කුවක බහා ලූ යෙව්සුකොප්, ලෙප්ටිනන්ට් දෙසට හැරුණි.

"ලෙප්ටිනට්, ඒ රහස් පණිවුඩය කුමක්ද? ඔබ මගේ ආර්සෙන්ටි යෙව්සුකොප්ගේ නායකත්වයෙන් සිටින රතු හමුදා බල ඇණියකට අසු වී සිටින නිසා කිසිවක් වසං නොකර ඒ පණිවුඩය ගැන කියනවා හොඳයි."

තද නීල වර්ණ අක්ෂි යුග්මය යෙව්සුකොප් දෙසට හැර වූ ලෙප්ටිනන්ට් පාවහන් යුවළේ විලුම එකට ගැටෙන හඬ ඇසෙන පරිදි ආචාර කළේය.

"යෙව්සුකොප් මහත්මයා, පුදුමයි. ඔතරම් උසස් පදවියක් දරන කිසිවකු සමග රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධකම් ඇති කර ගැනීමට මාගේ ආණ්ඩුවෙන් අවසර නොලැබීම අවාසනාවක්."

යෙව්සුකොප්ගේ පවා රක්තවර්ණ කම්මුල් සුදුමැළි විය. මුළු මහත් බලඇණිය ඉදිරියේ සිරකරුවා කිසිවක් ගණනකට නොගෙන මඳ සිනහවකින් මුව සරසාගෙන සිටියේය.

කොමිසාර් රිවොල්වරය සුරතට ගත්තේය.

"සුදු පරයා, මෙහෙ බලපන්! උඹේ කට, තොරතුරු කියන්නෙ නැත්නම් ඊයම් ගිලින්න වේවි."

ලෙප්ටිනන්ට් දෙවුර හකුළා ගත්තේය.

"මා මැරුවත් තොරතුරු කියන්නෙ නැහැ."

කොමිසාර් රිවොල්වරය පහත හෙළීය.

"උඹ සුං කරන්න ඉස්සර උඹ තවත් කෝලමක් නටාවි."

ලෙප්ටිනන්ට් කට කොනට සිනාවක් නංවා ගත්තේය.

කෙළ පිඬක් ගැසූ යෙව්සුකොප් පියවර නගන්නට විය.

"කොමිසාර් සහෝදරයා, මේ හාදයට වෙඩි පහර දෙක තුනක් දීලා මේක ඉවරයක් කරන්නද?" එක් රතු භටයෙක් විචාළේය.

කොමිසාර් නාසය කැසුවේය.

"වැඩේ හරියන්නෙ නැහැ. මට පේන්නෙ මේක ලොකු කේක් කෑල්ලක් වගේ. මේකව කසලිංස්ක් නගරයට භාර දෙන්න ඕනෑ. එහිදී උගේ රහස එළියට ගනීවි."

"එයාවත් කැන්දන්න? අපිටත් යන්න බැරුවයි ඉන්නේ."

ඉද්ද ගැසුවාක් මෙන් යෙව්සුකොප් කෙළින් සිටියේය.

"ඒකෙන් කාටවත් වැඩක් නැහැ. මා මොහු ගෙන යනවා. මා ඒකට වග කියනවා. ඒ ගැන කාටවත් කතාවක් නැහැ."

ඔහු හැරෙනවාත් සමගම ඔහුගේ ඇස්වලට මර්යුට්කා ලක් වූවාය.

"අපේ උතුමාණන් වහන්සේ ඔබට බාරයි මර්යුට්කා, හොඳින් බලාගන්න ඕනෑ. ඔහු පැන ගියොත් ඔබේ පිටේ හමත් යාවි."

රයිපලය උරිස්තලය මත රුවාගත් මර්යුට්කා කතා නැතිව සිරකරු වෙත ගියාය.

"මෙහාට එන්න. ඔබ මට භාර වී තිබෙනවා. මා ගැහැනියක නිසා මගෙන් ගැලවී යන්නට නම් හිතන්නට එපා. දිව්වොත් යාර තුන් සියයක් දුර ගියත් මැරී වැටෙන්නට වෙඩි තියනවා. එක සැරයක් නම් මගේ ඉලක්කය වැරදුණා! හත්තිලව්වයි! ආයෙත් එහෙම සිදුවෙන්නෙ නැහැ."

ඈ දෙස නෙතග බැල්මක් හෙළූ ඔහු සිනාසෙමින් හිස නමා ආචාර කළේය.

"එතරම් රමණීය කාන්තාවකගේ වසඟයට පත්වීම ගෞරවයක් කොට සලකන්නෙමි." ඔහු තොල මතුළේය.

"මොකක්ද මේ කෙඳිරිල්ල? මර්යුට්කා නැටිල්ලට වැඩි යමක් උඹලා දන්නෙ නැහැ. ඔය ඇති විරිත්තිල්ල. හා යමන්."

ඔව්හු කුඩා වැව් කණ්ඩියක එදා රාත්‍රිය ගත කළහ. අයිස් තට්ටුවට යට වූ දියෙහි පල් වූ පැළෑටිවලින් අයිඩින් ගඳ මිශ්‍ර පල් ගඳ වහනය විය.

කිර්ගීස් ජාතිකයන්ගෙන් ලබාගත් බුමුතුරුණු හා බ්ලැන්කට් පොරවාගත් ඔවුහු හොඳින් නිදා ගත්හ.

ඔටු හම් තීරුවකින් ලෙප්ටිනන්ට්ගේ අත්පා බැඳ එහි කොනක් තම ඉඟ වටා ඔතාගත් මර්යුට්කා එහි කොන අතින් දැඩිව ගෙන නිදා ගත්තාය.

භටයෝ ගොරවන්නට වූහ.

"ඒයි, මර්යුට්කා එයාගේ නියම ආදරවන්තයාට ගුරුකමක් කරලා."

මොර ගෙඩි මෙන් ලොකු ඇස් සහිත, සෙමියනොව් අනිකුත් භටයන් අමතා විහිළුවක් කළේය.

"ප්‍රීතියෙන් සිනාසෙන භටයන් දෙස මර්යුට්කා පිළිකුල් සහිත බැල්මක් හෙළුවාය.

"උඹලට හත්තිලව්වයි! උඹලට සෙල්ලම්. මෙයා පැනල ගියොත්?"

"පිස්සි, කොහෙද ඔයා පැනල යන්නෙ? කාන්තාරෙටද?

"කාන්තාරෙට නැත්නම් ඕනෑ දේවස්ථානෙකට."

"නිදාගන්නව!"

සිරකරු දෙසට හැරුණු ඈ කීවාය.

බුමුතුරුණු තුළට ලෙප්ටිනන්ට් ඇතුළු කළ මර්යුට්කා පසෙකින් හාන්සි වූවාය.

ලොම් රෙදිවල සුවපහස ලබමින් නිදාගැනීමට ලැබීම ඔහුට දිව්‍යමය සැපතක් විය.

බුමුතුරුණු පිට නිදන යෙව්සුකොප් ගොරවන්නට විය. සුවසේ නිදන මර්යුට්කාගේ මුහුණේ සිහිනයක ලකුණු පහළ විය. සිය ලස්සන දෙතොල් හිඩැස් නොසිටින ලෙස පියාගත් ගොවේරුකා - ඔට්‍රොක් උඩුබැලි අතට නිදන්නේය.

නිදි වර්ජිතව සිටියේ මුරකාවල් යෙදුණු භටයා පමණකි. තම බිරිඳට වඩා තම ජීවිතයටත් වඩා අගේ කළ රයිපලය දණිස් මත තබාගෙන පැදුර කෙළවර ඔහු හිඳගෙන සිටියේය.

සෝමාරි නියාවකින් සෙලවෙන ඔටුවන්ගේ මිණි ගෙඩි හඬ පැතිර යන සීතල වායු පටලය දෙස, මුර සෙබළා බලා සිටියි. දැන් ඔවුන්ට ඔටුවෝ හතළිස් හතර දෙනෙක් සිටිති. ඔවුන්ගේ අනාගතය පැහැදිලිය. කොතරම් දුෂ්කර වුවත් ඔවුන්ගේ ඉලක්කය කරා ඔවුන් යනවා ඇත. තවදුරටත් ඒ ගැන කිසිදු සැකයක් නැත.

සියුම් හඬක් නංවමින් හමා යන සීතල සුළඟ මුර සෙබළාගේ කබායේ අත් අස්සේ රිංගා ගත්තේය. උරිස් හකුළන ඔහු පැදුරු කෙළවරින් පිට වසා ගත්තේය. සීතල සුළං පහරින් වලකින ඔහුගේ සිරුර තුළ උණුසුම් ගතියක් කා වැදී තිබෙයි.

හිම අන්ධකාරයි.

පුදුම ආසියාතික රටක්!

"කෝ ඔටුවෝ? ඔටුවො, දෙවියනේ තාමත් නිදි, තාමත් මර නින්දෙ, මොකක්ද යෝධයෝ මේ කළේ? මේකට නම් උඹව හම ගහනවා!"

පා පහරින් අවදි වූ මුර භටයාගේ හිස කැරකෙන්නට විය. මත්වූවකු ලෙස හේ අවට බැලීය.

හිම ඝන අඳුර

උදෑසන මිහිදුම් පටලය. සෑම තැනම වැලි.

ඔටුවන් දකින්නට නැත.

ඔටුවන් ලැග සිටින තැන දක්නට ලැබුණේ උන්ගේ කුර සලකුණු හා කිර්ගීස් ජාතිකයන්ගේ පිය සටහන් පමණකි.

සෙබළ මුළ පසුපස පැමිණි කිර්ගීස් ජාතිකයන් තිදෙනකු මුර සෙබළා නිදිගත් වහා ඔටුවන් සොරාගෙන යන්නට ඇත.

රතු හමුදා භටයෝ දෙතුන්දෙනා වශයෙන් ගුළි වී නිශ්ශබ්දව සිටියාහ. ඔටුවන් දකින්නට නැත. උන් සොයා කොතනකට යමුද? එය නිෂ්ඵල වැඩකි.

"මේ වගේ බැල්ලිගෙ පුතෙකුට උණ්ඩයක් නාස්ති කිරීමත් පාපයක්!"

යෙව්සුකොප් බිරුසන් දුන්නේය.

"නිහඬව සිටි මුර සෙබළාගේ දෑසින් ගලා ආ කඳුළු කැට සීතලට හසුවීමෙන් මිදී ගියේය.

බුමුතුරුණ යට නිදා සිටි ලෙප්ටිනන්ට් ඇඹරෙන්නේය. අවට බැලූ ඔහු සිවුරුහන් බාන්නට විය.

"ඒ තමුසෙලාගේ විප්ලවකාරී වචන."

ඔලොක්කම් සිනහවක් පහළ කළ ඔහු කීය.

"කට වහපන්" කී යෙව්සුකොප් පිළිම ලෙස බලාගෙන සිටින භටයන් දෙස බලා,

"උඹලා මෙතන පැලවෙළාද? යමව්" යයි කීය.

ඉතා අමාරුවෙන් වැලි කඳු හා හෙල් තරණය කරමින් එකිනෙකා පසුපස පේළියට ගමන් කරන එකොළොස් දෙනෙකි. මේ භයානක ගමන පිටත්වීමෙන් පසු අතරමග දී දස දෙනෙක් ගමනක අවසානය දුටහ. සෑම උදෑසනකම වාගේ පීඩාවෙන් මැළ වී සුදුමැළි වී ගිය ඇස් අවසාන වරට විවෘත කර හාත්පස බලා හිරිවැටී ගිය දෙකකුල් හොඳින් දිගහැර අවසාන හුස්ම හෙළන කෙනෙකු දක්නට ලැබුණි.

වැටී සිටින භටයා වෙත පැමිණෙන රතු යෙව්සුකොප් (සුදුමැලි වූ කොමිසාර්ගේ මුහුණ තවදුරටත් ඔහුගේ කබාය හා සැසඳෙන්නේ නැත.) නිෂ්ඵලව බලා සිට හිස සලන්නේය. ඉක්බිති ඔහු සීතල වී තිබෙන රිවෝල්වරයෙන් වැටී සිටින භටයාගේ සිරුරේ ගිලී ගිය බොරු ඇසට වෙඩි තබයි. ඒ තුවාලයෙන් ලේ ගලන්නේ නැත.

මෘත ශරීරය මත වැලි ස්වල්පයක් අතුරා යළිත් ඔවුහු ගමනාරම්භ කරති.

ඔවුන්ගේ කබා, කලිසම් බුරුල් වී ඇද හැලෙන්නට විය. බුමුතුරුණු කැබලි පා බැඳගත් ඔව්හු ඇඟිලිද එම පටිවලින් වෙළාගත්හ.

සුළඟින් ලෙළෙන පන්බඩ වැනි දසදෙනෙක් ඇන් මරුකතර තරණයෙහි යෙදී සිටිති.

සුළඟින් ලෙළෙන පන්බඩ වැනි දසදෙනෙක් දැන් මරුකතර තරණයෙහි යෙදී සිටිති. පය පැකිලී වැටෙති. නැගී සිටිති. යළි ගමන් කරති.

ආරක්ෂක හමුදාවේ ලෙප්ටිනන්ට් ගොවේරුකා-ඔට්‍රොක් පමණක් කෙළින් ගමන් කරයි.

නොයෙක් විට රතු හමුදා භටයෝ යෙව්සුකොප්ට කංකෙඳිරි ගෑවෝය.

"කොමිසාර් සහෝදරයා, හැබෑටම මොහු කොතරම් දුර ඇදගෙන යන්නද? අපි මොහුට කන්න දෙන්නේ මොනවාද? මේ රෙදි, ඔහුගේ හොඳ රෙදි, මේවා අපට බෙදාගන්න බැරියැ?"

එහෙත් ඔහුට අනාදරයෙන් අත නොතබන ලෙස යෙව්සුකොප් ඉල්ලා සිටියේය.

"මගේ අවසාන ක්‍රියාව ඔහු බාරදීම වෙන්ට පුළුවනි, නමුත් මා එය කරනවා. ඔහුගෙන් අපට බොහෝ දේ දැනගන්නට ලැබේවි. මේ වගේ මිනිසකු නිකම් මරාදමන්නට බැහැ. බයවෙන්න එපා. එයාට ලැබෙන්නට තිබෙන දේ ලැබෙනවා ඇති."

ලෙප්ටිනන්ට්ගේ දෙඅත් වැලමිට ළඟින් ඔටුහම් පටියකින් බැඳ එය මර්යුට්කාගේ බඳ වටා බැඳ තිබේ. අඩියක් තබා අනික් අඩිය ගැනීමට තරම් මර්යුට්කාගේ ශක්තිය හීන වී ගියේය. ලේ හිඟවීමෙන් සුදුමැලි වූ ඇගේ මුහුණේ බළල් ඇස්වල කහ පැහැය වඩාත් කැපී පෙනුණි. එහෙත් ලෙප්ටිනන්ට්ගේ තත්ත්වයේ වෙනසක් නොවීය. වෙනසකට දක්නට ලැබුණේ සුළු සුදුමැලි ගතියක් පමණකි.

එකදවසක් ඔහු කරා ළංව යෙව්සුකොප් ඔහුගේ නිල් ඇස් දෙක වෙත බැල්මක් හෙළුවේය.

"තුඃ විතරක්! උඹේ ඇතුළේ මොනවද තියෙන්නේ? මස් නම් වැඩිය නැහැ. නමුත් දෙන්නකුගේ ශක්තිය."

ඔහු ගොරවන්නට විය.

සුපුරුදු ඔලොක්කම් හිනාව ලෙප්ටිනන්ට්ගේ දෙතොල් අතරට පැන්නේය.

සෑම පැත්තකම නෙතට හමුවූයේ වැලි කඳුය. සුළඟට හසු වූ වැලි කඳු මුදුන්වල වැලි, නයකුගේ පිඹීමට සමාන ශබ්දයකින් සුළඟට ගසාගෙන ගියේය. අවසානයක් පෙනෙනතෙක් මානයේ නැත.

"තවත් අඩියක්වත් යන්නට බැහැ. මට මෙතන සාමයෙන් මැරෙන්නට ඇරපල්ලා."

මෙසේ කියන අය, එකිනෙකා මිහිතලය මත සැතපුනෝය.

එහෙත් ඔවුන් කරා එන යෙව්සුකොප්, "ඔබ විප්ලවය පාවා දෙන්නේය." යි කියමින් කරන බලකිරීම නිසා යළිත් පියනගා ඔව්හු ගමන් කරති.

එක් හටයෙක් ඉතා අමාරුවෙන් උස් වූ වැලි කන්දකට බඩගෑවේය. අවට පරික්ෂා කර බැලූ ඔහු වියරු හඬකින් මොර දෙන්නට විය.

"ආං පේනවා ඇරල් මුහුද!"

ඔහු මුණින් වැටුණේය. යෙව්සුකොප් ඉතා අමාරුවෙන් කඳු මුදුනට නැංගේය. විඩාවෙන් ඉදිමී තිබුණු ඔහුගේ දෑසට නිල්වන් මුහුද හමුවීය. ඇස් පියාගත් ඔහු නැඹුරු වී පොළොව සූරන්නට විය.

කොලොම්බස් ගැන කොමිසාර් අසා නැත. 'ගොඩබිම' යන වචනය කන වැකුණු කෙණෙහි කොලොම්බස්ගේ ස්පාඤ්ඤ ජාතික නැවියන් තම යාත්‍රාවේ ලෑලි සීරූ බවද ඔහු නොදන්නේය.

ලෙප්ටිනන්ට් සමග මර්යුටිකා පළමුවැනි සාකච්ඡාව කළ අතර කොමිසාර් ගමනට යාත්‍රාවක් සූදානම් කරයි.

ඉදවැනි දිනයෙහි වෙරළබඩ පිහිටි කිර්ගීස් ගම්මානයකට ඔව්හු සම්ප්‍රාප්ත වූහ. වැලි කඳු උඩින් හමා ගිය සුළඟේ කා වැදී තිබුණු දැවෙන ගොම ගඳ නිසා ඔවුන්ගේ හිස් බඩදඟලන්නට විය. තව ටිකක් දුර ගිය ඔවුන්ගේ දර්ශන පථයට යුර්ටා නමින් හඳුන්වනු ලබන කුඩා ගෙවල් සමූහයක් ගොඳුරු විය. තව තවත් ගම්මානයට ළං වූ ඔවුන් පිළිගැනීමට මෙන් වැහැරී ගිය සුනඛයන් කිහිප දෙනෙක් ඔවුන්ගේ පෙරමුණට දිව ආහ.

ඔවුන් කරා එන මේ මිනිස් කොවුල් දෙස අනුකම්පාවෙන් හා පුදුමයෙන් විශ්මිත වූ ගම් වැස්සෝ, ගෙවල්වලට රොක් වී බලා සිටියහ.

වක් නහයකින් යුක්ත වූ මහලු ගම් වැසියෙක් තම පපුව පිරිමදින්නට විය.

"සලාම්, තුරා, කොහේද මේ යන්නේ?"

බලවත් දුර්වලත්වයකින් පීඩිතව සිටි යෙව්යුකොප් තමා වෙත පිරිනමන ලද මිත්‍රත්වයේ හස්තය පිළිගත්තේය.

"අපි රතු භටයෝ, කසලින්සක් යනවා. අපට කන්න මොකවත් දෙන්න. මේ පළාතේ සෝවියට් සභාවෙන් යුෂ්මතුන්ට තෑගි ලැබේවි."

කුඩා රැවුල පිරිමැද්ද කිර්ගීස් ජාතිකයා දෙතොල් ලෙව කෑවේය.

"උයි, බායි, රතු හමුදාවේ මිනිස්සු! මොස්කෝවේ ඉඳලද එන්නේ?"

"නැහැ. මොස්කෝවෙන් නොවේ ගුර්යිව් ඉඳල."

"ගුර්යිව්? උයි, බායි! උයි, බායි! කාරා - කුම් ඉඳලා?"

පෙබරවාරි මාසයේ ප්‍රචණ්ඩ කුණාටුව ජය ගනිමින් ගුර්යිව් නගරයේ සිට ඇරල් මුහුද දක්වා මරු කතර තරණය කළ සුදුමැලි වූ මේ සොල්දාදුවන්ගේ විශිෂ්ට ක්‍රියාව කෙරෙහි ගෞරවයත්, භීතියක් මහල්ලාගේ අදහස්වලින් පළවිය.

මහල්ලාගේ අත්පිඩු තැලීම අසා එහි දිව ආ ගැහැනුන් අමතා, විධානයක් කළ ඔහු කොමිසාර් අතින් අල්ලා ගත්තේය.

"එන්න, එන්න ටිකක් නිදාගෙන විඩා හැර කෑම කන්න."

උණුසුම් ගෙවල්වල හාන්සි වූ භටයෝ අප්‍රාණික මස් ගොඩවල් මෙන් සවස් වන තුරු නිදාගත්හ. අවදි වූ ඔවුන්ට ආහාර පිළිගැන්වූ කිර්ගීස්වරු ඔවුන් වළඳන තුරු පිට පිරිමදින්නට වූහ.

"කන්න, කන්න, හරි දුර්වලයි! කෑව නම් ශක්තියි."

ක්ෂුධාවෙන් පීඩාවට පත් ව සිටි රතු භටයෝ ලහි ලහියේ කෑදර ගතියකින් ආහාර ගත්හ. ප්‍රමාණය ඉක්මවා ආහාර ගත් ඇතැම් අයට අසනීප ගතියක් දැනෙන්නට විය. ආහාරයෙන් පිනා ගිය ඔව්හු යළිත් නිදන්නට වූහ.

එහෙත් මර්යුට්කා හා ලෙප්ටිනන්ට් නිදා නොගත්හ.

දැවෙන ලී කොට අසල වාඩිගත් මර්යුට්කා තමා විඳි දුක් සියල්ල අමතක කළාය. තම පේටකය අත ගා පැන්සල් කොටයක් සොයා ගත් ඈ ගැහැනියක විසින් දෙන ලද සඟරා පිටුවක යම්කිසිවක් ලියන්නට වූවාය. මෙම කොළයේ මුදල් ඇමති කොකොවොට්සිව් සිටුවරයාගේ ඡායාරූපයක් පළ වී තිබුණි. ඒ ඡායාරූපයේ පළල් නළල් තලය හා සුදු රැවුල මත මර්යුට්කා කිසිවක් ලියුවාය.

ලෙප්ටිනන්ට්ගේ දෙඅත් බැඳි ඔටු හම් පට තවමත් මර්යුට්කාගේ ඉණ වටා දැවටී ඇත. ආහාර ගැනීම සඳහා පැයකට පමණ ඔහුගේ අත් මර්යුට්කා විසින් බන්ධනයෙන් මුදන ලදී. ආහාරයෙන් පසු යළිත් එම අත් බන්ධනයට අසු විය.

රතු හමුදා භටයෝ කට පියාගෙන සිනාසුණාහ.

"දම්වැලට අසුවුණු බල්ලකු වගේ." ඔවුහු කීහ.

"හිත උණුවෙලා වගෙයි, එහෙමද මර්යුට්කා? එහෙනම් එයාව ළඟට කර බැඳගන්න. තදින් බැඳ ගන්න. නැත්නම් සුරංගනාවියන් ඇවිත් කලාලය යට රිංගල එයාව රවටාගෙන යාවි."

මර්යුට්කා භටයින්ට උත්තරදීමට උත්සාහ නොකළාය.

නිවසේ කුලුනු කණුවකට පිට දී වාඩි වී සිටි ලෙප්ටිනන්ට් මර්යුට්කාගේ අතේ වූ පැන්සලය සෙලවෙන ආකාරය දෙස ඇසිපිය නොහෙළා බලා සිටියේය.

මඳක් ඉදිරියට නැඹුරු වූ ඔහු ඈ ලියන්නේ කුමක්දැයි? ප්‍රශ්න කළේය.

නළල ඔස්සේ මුහුණට වැටුණු කෙස් රොදක් අස්සෙන් මර්යුට්කා ඔහු දෙස බැලුවාය.

"ඒකෙන් ඔබට වැඩක් නැහැ!"

"සමහර විට ලියමනක් ලියනවා වෙන්නට ඇති. කියන්න එය මම ලියා දෙන්නම්."

මර්යුට්කා සිහින් සිනාවක් පහළ කළාය.

"හරි ලස්සන වැඩේ! අත්දෙක ලිහාගෙන මගේ කනට විඳල පැනල දුවන්න, හිතාගෙන ඉන්නවද මා මෝඩියක් කියලා? මට ඕනෑ නැහැ ඔබේ උදව්ව. මා ලියන්නෙ ලියමනක් නොවේ. කවි."

ලෙප්ටිනන්ට්ගේ ඇසිපිය පුදුමයෙන් පියවිණි.

"කවි? කවි ලියන්න ඔබට පුළුවන්ද?

විළියෙන් බර වූ මර්යුට්කාගේ අතේ තිබුණ පැන්සලයේ ගමන නතර විය.

"මොකද විරිත්තන්නෙ? ඔබ හිතුවද නටන්න දන්නෙ ඔබ පමණයි. මා නිකම් මීදෙනක් කියල?"

ලෙප්ටිනන්ට් අත් එහා මෙහා කළ නමුත් බන්ධනය හිරවිය.

"මම නම් එහෙම හිතන්නෙ නැහැ මට පුදුම හිතුණා. ඔබ හිතනවද මේ වෙලාව කවි ලියන්න සුදුසුයි කියා?"

මර්යුට්කා පැන්සලය පසෙකට කළාය. ඈ සිය හිස පස්සට ගැස්සීමෙන් කණුව සෙලවී මළකඩ කැබලි උරිස් මත වැටුණි.

"ඔබ පුදුම මිනිහෙක්, කවි ලියන්න පිහාටු මෙට්ටයක් උඩ හාන්සි වෙන්න ඕනැද? මගේ හැඟීම් මා තුළ පැහෙනවා. ඒ සියල්ල - අපි සීතලෙන්, බඩගින්නෙන් මිරිකෙමින් කාන්තාරය පසු කළ හැටි ලියන්න දිවා රෑ කල්පනා කිරීම වැරදිද? මට එය මිනිසුන්ගේ පපුවට කාවදින ලෙස ලියන්නට ඇත්නම්! මා මේවා ලියන්නේ ලේවලින්! සමහරු කියනවා කවි ලියන්න කලියෙන් මා ඉගෙනගත යුතුලු. ඉගෙනීම! මේදවස්වල ඉගෙන ගන්නත් කාලයක් තිබෙනවාද? මේ කවි ගලා එන්නේ මගේ හදවතින්, මගේ චාම් ගතියෙන්."

ලෙප්ටිනන්ට්ගේ මුවග සිනා රැල්ලක් පහළ විය.

"ඔය කවිය කියවන්න බලන්න. මටත් කවි ගැන ටිකක් තේරෙනවා."

"ඔබට මේක නම් තේරෙන්නෙ නැහැ. ඔබේ ඇඟේ තිබෙන්නේ ධනවත් මිනිසකුගේ ලේ. ඔබ වගේ අය නිතරම ලියන්නෙ මල් ගැන. ආලය ගැන, මා ලියන්නෙ දුප්පතුන් ගැන, විප්ලවය ගැන."

ශෝකාකුල ස්වරයකින් ඈ පළ කළාය.

"ඇයි මට ඔය කවි නොතේරෙන්නෙ? සමහර විට මා එවැනි කරුණු ගැන නොයෙන එක ඇත්ත. නමුත් කෙනකු තේරුම් ගන්නට කෙනකුට පුළුවනි."

මර්යුට්කා නොකැමැත්තෙන් කොකොව්ට්සිව්ගේ ඡායාරූපය පළ වී තිබුණු සඟරා කොළය පෙරලුවාය.

"කෙහෙල්මල, හොඳයි එහෙනම් අහගන්න. හිනා වෙන්න එපා. මා හිතනවා ඔබ අවුරුදු විස්ස වෙනකල් ආයම්මාගේ අතේ වැඩෙන්න ඇති. මම නම් හැදුණේ නිදැල්ලේ."

"හිනා වෙන්න ඕනෑකමක් නැහැ!"

"හොඳයි. අපි කොසැක්වරුන්ට විරුද්ධව සටනක් කළ හැටි, කාන්තාරයෙන් බේරුණු හැටි, සියල්ලම මා ලීවා."

මර්යුට්කා උගුර පෑදුවා ය. ඈ පහත් ස්වරයකින් කවිය කියන්නට වූවාය.

සාර්ගේ අලුගෝසුවන් වූ
කොසැක්වරු අප පිටට පැන්නා
පලක් එතරම් නුවූමුත් අප
ඔවුන් හට වෙඩි පහර දුන්නා

එතැන උන් මහ රැසක් සිටියෙන්
අපට පසුබැස යන්න වූවා
"කොසැක්වරුනට පහර දිය යුතු"
යෙව්සුකොප් වීරයා කීවා

පටන් ගත්තෙමු වෙඩි තියන්නට
සටන් වැදුණේ මාරයන් මෙනි
ඉතිරි වී විසිදෙනකු පමණක්
අපේ බලඇණි සුනේ සුන් විණි

"නමුත් මට මේ ජීවිත කාලය තුළ දී මේක ඉවර කරන්න බැහැ. හත් ඉලව්වයි! ඔටුවන් ගැන ලියන්න මා දන්නෙ නැහැ."

දුබල ස්වරයකින් ඈ කීවාය.

"ඔබේ තරමට හොඳයි. කව් පේළිවල හැඟීම් හා අර්ථ ප්‍රකාශය බෙහෙවින් තියෙනවා. කාටත් පෙනී යනවා මේ වචන හදවතින්ම ගලා ආ බව."

මේ අවස්ථාවේදී ලෙප්ටිනන්ට් කහින්නට වූ නමුත් එය මැඩපවත්වාගෙන ඔහු යළි කතා කළේය.

"නමුත් අමනාප වෙන්න එපා. කවි නම් හොඳ මදියි. චමත්කාරයක් නැහැ! කවිත්වයකුත් නැහැ!"

අත තිබූ කඩදාසිය බිම තැබූ මර්යුට්කා කුඩා නිවෙසේ වහල දෙස බැලුවාය. උරිස් හැකුළුවාය.

"ඒ කවිවල හැඟීමක් තිබෙන බව මා කීවා නේද? සිදුවුණු දේ කියන විට මාගේ මුළු සරුවාංගයම ඇඬෙනවා. චමත්කාරය! ඔබ වගේ හැම දෙනෙක්ම කියන්නේ එය නැති බවයි. "කිසි කවිත්වයක් නැහැ. මේවා පළ කරන්න බැහැ." මොකක්ද චමත්කාරය කියන්නේ? ඔය රහස මොකක්ද? ඔබ පොත්පත් ඉගෙනගෙන තිබෙනවානෙ? ඉතින් මට කියලා දෙන්න බැරිද?"

ශෝකයට පත් මර්යුට්කා ගෞරව පූර්වකව ඉල්ලා සිටියාය.

ලෙප්ටිනන්ට් මඳක් පමා වී පිළිතුරු දුන්නේය.

"ඒක අමාරු කාරණයක්. කවි ලිවීම කලාවක්. සෑම කලාවක්ම ඉගෙන ගන්න ඕනෑ. ඒ හැම කලාවකම ඊටම වෙන් වූ නීතිරීති තිබෙනවා. නිදසුනක් ගනිමු. ඉංජිනේරුවෙක් පාලමක් සෑදීමේ නීති රීති නොදන්නේ නම්, සමහර විට එයාට පාලමක් හදන්න බැහැ. හැදුවත් එයින් වැඩක් ගැනීමට පුළුවන් වෙන්නෙ නැහැ."

"ඒ පාලමක්! ඒකට ගණන් හිලව් දැනගන්න ඕනෑ. නමුත් මා උපන්දා සිට මා තුළ කවි පහළ වුණා. එය සමාජ දක්ෂතාවක් වෙන්න පුළුවනි."

"සමහර විට සහජ පුරුද්ද, දක්ෂකම වුවත් දියුණු කරන්නට ඕනෑ. ඉංජිනේරුවෙක් දොස්තර කෙනකු නොවී ඉංජිනේරුවකු වෙන්නෙ, බාල කාලයේ සිට ඔහු ගොඩනැගිලි තැනීමට දැක්වූ ආශාව නිසයි. නමුත් එයා ඉගෙන නොගත හොත් ඒ ආශාවෙන් වැඩක් වෙන්නෙ නැහැ."

"හත් ඉලව්වයි! මේ ගමන් අවසන් වූ වහාම මා පාසලකට ගොහින් කවි ලියන්න ඉගෙන ගන්නවා! කවි ලියන්න උගන්වන පාසල් තිබෙනවා නේද?"

"තිබෙන්න පුළුවනි."

"අන්න, මා යන්නෙ එහෙම පාසලකට. මම නම්, මේ කවි පොත මුද්‍රණය කර, ඊට යටින් මාරියා බසොව් යන මගේ නම දකින්න තරම් වෙන කිසිවකට ආසා කරන්නෙ නැහැ."

ගිනිමැලය නිවී ගියේය. වහලේ සුළං හැපී නැගෙන හඬ අන්ධකාරය ඔස්සේ දිව ගියේය.

"ඔය හම් පටිවලින් රිදෙනවා ඇති!"

මර්යුට්කා හදිසියේම කීවාය.

"වැඩිය රිදෙන්නෙ නැහැ. හිරි වැටෙනවා."

"ඔබගේ ගෞරවය පරදුවට තබා දිවුරනවා නම් අත්දෙක ලිහනවා."

"කොහෙද දුවන්නෙ? නරින්ට ගොදුරු වෙන්නද? මා එතරම් මෝඩයෙක් නෙවෙයි."

"කමක් නැහැ, එහෙනම් දිව්රන්න. මා සමග කියන්න : ඔවුන්ගේ අයිතිවාසිකම් සඳහා සටන් කරන, කම්කරු පන්තිය පල්ලා රතු හමුදාවේ මාරියා බසොව් පල්ලා මා පැන යන්නෙ නැහැ."

ලෙප්ටිනන්ට් දිවුරුවේය.

අත් බැඳ තිබුණු බැම්ම බිඳී ගියේය. ප්‍රීතියෙන් පිනාගිය ලෙප්ටිනන්ට් අත්දිග හැරියේය.

"දැන් නින්දට යන්න. පැනල ගියොත් ඔබ වැනි අසමජ්ජාතිකයෙක් තවත් නැහැ. මෙන්න කළාලය.

"ස්තුතියි! මා මේ කබාය පොරවා ගන්නවා. මාරියා සුබ රාත්‍රියක් වේවා!"

"මාරියා පිලිටොව්නා"

පලස පොරවා ගනිමින් මර්යුට්කා තම නම නිවැරදි කළාය.

තමා ගැන මධ්‍යස්ථානයට දැනුම් දීමට මාර්ගයක් සොයමින් යෙව්සුකොප් වෙහෙසුණේය. එහෙත් මාර මුඛයෙන් බේරුණු තම භටයන්ට විශ්‍රාමය අතිශයින් අවශ්‍ය බව හේ

දනී. සතියක ඇවෑමෙන්, මූදු තීරයේ ගමන් කොට ඇරල්ස්ක් නගරයට පැමිණ එතැනින් කෙළින්ම කසලිංස්ක් බලා පිටත්වීමට යෙව්සුකොප් තීරණය කළේය.

දෙවැනි සතිය ආරම්භ වෙත්ම එහි පැමිණි කිර්ගීස් ජාතිකයන් කණ්ඩායමකගෙන්, එතැන් සිට වෙරළ ඔස්සේ වර්ස්ට් හතරක් ගිය තැන කුණාටුවකින් බිඳී ගිය වල්ලමක් පාවී තිබෙන බව දැනගත් යෙව්සුකොප් එය බැලීම සඳහා එතැනට ගියේය.

ඕක් ලීයෙන් තනන ලද එය අලුත් වල්ලමකි. රුවල හා අවල බිඳී ගොස් තිබුණි.

තම සගයන් සමග සාකච්ඡා කළ යෙව්සුකොප් වල්ලම ආධාර කොට ගෙන සිව් දෙනෙකු සිර්-දර්සා ගං මෝයට යැවීමට තීරණය කළේය.

"ඒක නම් හොඳම වැඩේ. පළමුවෙන්ම අපේ හිරකරු භාර දෙමු. අපේ ගමනේදී මොනවා වේදැයි කවුද දන්නේ? මොනවා වුණත් මිනිසා එහාට භාරදෙන්න ඕනෑ. දෙවැනි කරුණ, මේ කණ්ඩායම නිසාම අපට එහෙන් රෙදිපිළි කෑම ටිකක් එවාවි. සුළං හොඳින් තිබුණොත් ඇරල් මූද හරහා යන්න දවස් තුන හතරක් යාවි. පස්වැනිදා කසලිංස්ක් නුවරට යන්න පුළුවනි."

වාර්තාවක් සම්පාදනය කළ යෙව්සුකොප් ඒ සමග ලෙප්ටිනන්ට් අත තිබූ ලියමනත් දවටා කැන්වස් කවරයක දැමුවේය.

කිර්ගීස් කාන්තාවන් රුවල සකස් කළ අතර යෙව්සුකොප් අවල සෑදුවේ ය.

පෙබරවාරි මාසයේ සීතල උදෑසනක මේ වල්ලම දියත් කරන ලදී.

"සියල්ල ඔබට භාරයි. සිදුවන සියල්ලට උත්තර ඔබගෙන්. නිලධාරියා රැකගන්න ඕනෑ. මිනිහා පැනල ගියොත් ඔබට මනුෂ්‍ය ලෝකේ ඉපදීම ගැන දුක්වෙන්නට සිදුවේවි. පණපිටින් හෝ මරලා හෝ එහාට භාරදෙන්න ඕනෑ. එයාගෙන් බේරෙන්න බැරිවුණොත් පණපිටින් යන්න දෙන්න එපා. ආයිබෝවන්!"

අවසාන වශයෙන් යෙව්සුකොප් මර්යුට්කා අමතා කීය.

ප්‍රයිඩේ හමුවීමට වැඩි කලක් ගත නොවීම හැර
අන් සියල්ල ඩැනියෙල් ඩිපෝගෙන් සොරා ගන්නා ලදී.

ඇරල් මුහුද විනෝදය ගෙන දෙන මුහුදක් නොවේ. එය පඳුරු, වැලිතලා, වැලි කඳු, ගල්මුල්වලින් ගහණය.

කැවුම් මෙන් මතු වූ කුඩා දිවයින් එහි බහුල වශයෙන් දක්නා ලැබේ. ඇතැම් දිවයිනක් ජලයෙන් මතු වී තිබෙන්නේ අඟල් කිහිපයක් පමණකි.

පක්ෂීන් මෙහි නැත. විශාල ගස් නැත. මනුෂ්‍ය වාසයෙන් තොරය. එහෙත් ග්‍රීෂ්ම ඍතුවේදී මිනිසුන්ගේ ගැවසීම් පවතියි.

ඇරල් මුහුදේ පිහිටි විශාලම දිවයින බර්සා - කෙල්මස් යනුවෙන් හැඳින්වේ.

මේ බර්සා කෙල්මස් යන්නෙහි නියම අර්ථය කිසිවකු නොදන්නා නමුත් එහි අදහස 'මාර දිවයින' යයි කිර්ගීස් ජාතිකයෝ පවසති.

ග්‍රීෂ්ම ඍතුවේදී ඇරල්ස්ක් නගරයේ ධීවර කාර්මිකයෝ බර්සා- කෙල්මස් දිවයිනට පැමිණෙති. මෙහි පන්න කිරීමෙන් ගජ වාසි ලැබේ. මාළු අයින් බෙහෙවින් සිටිති. එහෙත් සීත ඍතුවේ ලකුණු පහළ වෙන්නා හාම මේ මසුන් මරන්නෝ ඇරල්ස්ක් නගරයට පැමිණෙති.

අල්ලාගෙන තිබෙන මාළු දිවයිනෙන් පිට කරන්නට පෙර හිම කුණාටු ඇරඹුණොත්, ඒ මාළු වැලි ගසා තනන ලද

මඩුවල ලුණු දමා තබා ඇරල්ස්ක් නගරයට පැමිණීම මසුන් මරන්නන්ගේ සිරිතය.

දැඩි සීත කරණකොටගෙන ඇතැම් විට චර්නිෂොව් බොක්කේ සිට බර්සා - කෙල්මස් දක්වා ජල තලය එකම හිම තට්ටුවක් බවට පරිවර්තනය වන්නේය. එවිට නරි රංචු පිටින් මාළු කෑම සඳහා බර්සා- කෙල්මස් දිවයිනට එති.

නොවැම්බර් සිට පෙබරවාරි දක්වා මේ ප්‍රදේශයේ හිම කුණාටු රජකරයි. ඉතිරි කාලයේ ස්වල්ප වශයෙන් වැස්ස ලැබෙන අතර ග්‍රීෂ්ම ඍතුවේදී ඇරල් මුහුද දර්පණ තලයක් මෙන් පැහැදිලිය.

කෙසේ වුවත් ඇරල් මුහුද විනෝදයෙන් තොරය. එහි තිබෙන්නේ එකම ලක්ෂණයකි. පුදුමාකාර නීලවර්ණය!

විල්ලුද මෙන් තද නීල වර්ණය අස්වාභාවික දර්ශනයකි.

මර්යුට්කා හා පිරිස පිටත් කිරීමේ දී සතියක් පමණ ගතවෙන තුරු කුණාටුවක් ඇති නොවේ යැයි කොමිසාර් කල්පනා කළේය. ගම්මානයේ වැඩිමහලු උදවිය, කිසිම කුණාටුවක ලක්ෂණ පහළ වී නැතැයි පළ කළහ.

මර්යුට්කා ලෙප්ටිනන්ට් හා රතු හමුදා භටයන් දෙදෙනාද (සෙමියනි හා ව්‍යාකීර් දෙදෙනා තෝරාගන්නා ලද්දේ මුහුදු ගමන් ගැන යමක් දැන සිටි නිසාය.) රැගත් වල්ලම කසලිංස්ක් නුවර බලා යාත්‍රා කරයි.

ගමනට ප්‍රමාණවත් සුළං ලැබීමෙන් රුවල පිම්බී ගිය අතර, අවල අසලින් සණ සුදු පෙණ නැංගේය.

මර්යුට්කා ලෙප්ටිනන්ට්ගේ අත්බැම්ම මුදාලූවාය. ඒ පාළු මුහුදේ කෙනෙකුට පැන යන්නට තැනක් නැත. ලෙප්ටිනන්ට් ගොවොරුකා-ඕට්‍රෝක් සෙමියනි හා ව්‍යාකීර් සමග හබල ඇල්ලූහ.

තමාගේ වාරය අවසාන වූ විට වල්ලම අස්සේ පලසක් පොරවාගෙන හාන්සිවෙන ඔහු, ඔහුටම සීමා වූ, කිසිවෙකුට හෙළිදරව් නොකළ හැකි, නිලධාරි හැඟීම් මධ්‍යයේ ගිලා බසින්නේය.

මෙය මර්යුට්කාගේ කණස්සල්ලට හේතුවිය.

"හැම විටෙකම ඔහු නියවන්නේ ඇයි? මිනිහා විකාරයෙන් වගේ. නමුත් එයාට වෙන දේ පැහැදිලියි. ප්‍රශ්නවලට උත්තර දෙන්න වෙයි. ඉන්පසු.. ඉවරයි." ඈ කල්පනා කළාය.

මර්යුට්කාගේ හැඟීම් නොදත් ලෙප්ටිනන්ට් සුපුරුදු අඩ සිනාවෙන්ම කල් ගත කළේය.

අවසානයේ දී ඈ තුළ පහළ වූ සැකය සීමා පවුරු බිඳගෙන එළියට පැන්නේය.

"ඔරු පදින්න ඔබ ඉගෙන ගත්තේ කොහේදීද?"

අවසානයේ දී ඈ ප්‍රශ්න කළාය.

ලෙප්ටිනන්ට් මඳක් කල්පනා කළේය.

"සැන්ට් පීටර්ස්බර්ග් නුවර දී, මා ළඟ ලොකු යාත්‍රාවක් තිබුණා. මා ඒකෙන් මූදු ගියා.

"යාත්‍රාවක්?"

"ඔව් රුවල් ඔරුවක්."

"මා ඒක දන්නවා. ඔය වගේ යාත්‍රා ඇස්ට්‍රකාන්වල දී මා එමට දැක තිබෙනවා. ඔබ වැනි ධනපතියන්ට ඒවා ඕනෑපදම් තිබෙනවා. ඒකෙ නම මොකක්ද?"

"නෙලී"

"පුදුම නමක්."

"ඒ මගේ සහෝදරීගේ නම! ඒ නම මා රුවල් ඔරුවටත් තැබුවා."

"හොඳ ක්‍රිස්තියානිවරු ඔරුවලට එවැනි නම් තබන්නෙ නැහැ."

"ඇගේ නම නෙලිනා. එහෙත් ඉංගිරිසි පුරුද්දට අනුව අපි ඈට කතා කළේ නෙලී කියා."

සියල්ලට පොදුවේ බෙදී ගිය සුදුමැලි හිරු රැස්දහර දෙස මර්යුට්කාගේ දෙනෙත් යොමු විය. ඉර බැස යමින් තිබුණි.

"අතිශයින් නිල්වන් මේ ජලය! කැස්පියන් මුහුදට සමාන පාට. මෙතරම් නිල් පාට මුහුදක් ඔබ දැක තිබෙනවාද?"

"පොරල් කියන අන්දමට මේ තුන්වැනි මුහුද"

ලෙප්ටිනන්ට් තමාට ඇසෙන ලෙස හෙමින් කීය.

"ඒ මොකක්ද?"

ලෙප්ටිනන්ට් දෙස හැරුණු මර්යුටිකා ත්‍රාසයෙන් ප්‍රශ්න කළාය.

"මේ වතුර ගැන මටම කියාගත්තා. ජල ශාස්ත්‍රය පිළිබඳ පොතක මා දුටුවා. මේ මුහුදේ ජලය ලා නිල් වර්ණයෙන් යුක්ත බව. පොරල් නමැති විද්‍යාඥයා මුහුදු ජලයේ වර්ණය අනුව ඒවා වර්ග කර තිබෙනවා. ඉතා නිල් ජලය තිබෙන්නේ පැසිපික් මුහුදේ. ඔහුගේ වර්ග කිරීම අනුව වර්ණය අතින් අරල් මුහුද තුන්වැන්නයි.

වර්ණ ප්‍රභේදය දක්වන පොරල්ගේ එම රේඛා චක්‍රය මනසෙහි මවාගන්නාක් මෙන් මර්යුටිකා කල්පනාකාරී වූවාය.

"මීට වඩා නිල් පැහැති දෙයක් ගැන කල්පනා කරන්න අමාරුයි."

හදිසියේම ඇගේ බළල් ඇස් ලෙප්ටිනන්ගේ නීල වර්ණ ඇස්වල ගැටුණි. විශේෂ කරුණක් සොයා ගත්තකු සේ ඇගේ සර්වාංගය තුළ එක්තරා හැඟීමක් පැතිර ගියේය. පුදුමයෙන් මෙන් ඇගේ දෙතොල් විවර විය. ඈ කෙඳිරි ගෑවාය.

"ඔබේ ඇස් හරියට මේ වතුර වාගෙයි. මා හිතනවා මේ වතුර සමග කිසියම් සම්බන්ධකමක් ඇත කියා."

ලෙප්ටිනන්ට් කිසිවක් නොකීවේය.

ඈත ක්ෂිතිජය දම්පැහැ ගැන්විණි. ඈත ජලය තද නීල වර්ණයකට පරිවර්තනය විය. ජලතලය පිසගෙන තද සීත සුළඟක් හමා ගියේ .

"නැගෙනහිර පැත්තෙන්"

තම ඇඳුම් කට්ටලයේ කඩමළු පොරවා ගනිමින් සෙමියාන් කීවේය.

"කුණාටුවක් වගෙයි" ව්‍යාකීර් කීය.

"ආපුදෙන්. තව පැය දෙකකින් බර්සාව පෙනේවි. සුළං තද වූවොත් එහි නවතිමු."

කවුරුත් නිශ්ශබ්ද වූහ. ක්‍රමයෙන් නැගී ගෙන එන රළ පෙළට හසුවෙන වල්ලම උස් පහත් වෙමින් ඉදිරියට යයි. වැහිකළු ගුවන් තලයේ නැගී එයි.

"නිසැකයෙන්ම කුණාටුවක්."

"බර්සාව දැන් ළඟයි. සමහර විට එහි නතරවෙන්නට සිදුවෙයි. බර්සා මහා ඉලව් තැනක්. හැමතැනම වැලිකඳු. ඒ මදිවට සුළං. රුවල් බාපල්ලා!"

එහෙත් ලෙප්ටිනන්ට් පමා විය. දිය රැල්ලකට යටගිය වල්ලමේ සිටි අයගේ මුහුණු මුහුදු දියෙන් තෙමී ගියේය.

"ඇයි මට කෑ ගාන්නේ? මාරියා පිලටොව්නා හබල බාන්න."

"හබල බාන්න? හත්තිලව්වයි! ඔබ කියන්නේ මොනවාදැයි තේරුම් ගෙන කතා කරන්න. අවුරුදු පහේ පටන් හබල අල්ලන්න මාත් පුරුදු වුණා."

දැවැන්ත කිඹුලුන් මෙන් නැගීගෙන එන රැළි පෙළ වල්ලමට පැන්නේය.

"දෙවියනේ, බර්සා නගරය කෝ? සියල්ල අන්ධකාරයි."

ව්‍යාකීර් වම් අත දෙස බැලුවේය.

"හුරා! අන්න පේනවා."

ඔහු ප්‍රීතියෙන් කෑ ගැසුවේය.

"මහ කරදරකාරී තැන. දෙවියන්ගෙ කැමැත්තෙන් අපට එහි යන්න පුළුවනි." සොමියනි කෙඳිරිගෑවේය.

එවිටම වල්ලමට වැදුණු මහා රැළකින් එහි තුළට වතුර පිරුණි.

හුන් තැනින් නැගිටගත් මර්යුටිකා, "ඉහපල්ලා, ඉහපල්ලායි මොර දුන්නාය.

"ඉහින්න? මොකෙන්ද ඉහින්නේ?"

"උඹලගෙ තොප්පිවලින්."

සිය හිස් වැසුම් අතට ගත් සොමියනි හා ව්‍යාකීර් නොකැමත්තෙන් මෙන් වල්ලම පතුලේ රැඳී තිබුණු දිය ඉහින්නට වන්හ. මඳක් පසුබට වූ ලෙප්ටිනන්ට් ටික වේලාවක් බලා හිඳ තම හිස් වැසුමද ගෙන ඔවුන්ට එක් විය.

ඈත ක්ෂිතිජයේ දිස් වූ සුදුවන් ගොඩබිම ඉක්මනින් වල්ලම කරා ළංවන්නට විය. එය හිමෙන් වැසුණු වෙරළකි.

සුළඟ තව තවත් චණ්ඩ වූයෙන් දැවැන්ත රළ පෙළ වල්ලමේ වේගයෙන් වැදේ. වේගවත් සුළං රැල්ලක් වැදී රුවල පැලී ගියේය. වෙඩි හඬකට බඳු හඬක් ඉන් නිකුත් විය.

ඉරී ගිය රුවල් කැබලි වෙඩි පුපුරන්නාක් මෙන් මාරුතයෙන් ලෙළෙන්නේය.

අවල අදිමින් මර්යුට්කා,

"අල්ලපල්ලා" යි මොර දුන්නාය.

එවිටම මහා දිය රැල්ලක් වැදුණු වල්ලම පැත්තකට ඇළ විය. එය යළිත් කෙළින් වූ විට සොමියනි හෝ ව්‍යාකීර් පෙනෙන්නට නොසිටියෝය. දිය රැල්ලෙන් වල්ලම හරි අඩක් දියෙන් පිරී ගොස් තිබුණි. ඉඟටියෙන් යටි භාගය දියේ ගිලෙමින් සිටි ලෙප්ටිනන්ට් දෙස බලා මර්යුට්කා විධානයක් කළාය.

"හෙන ගහපන්, වතුර ඉහපන්!"

තෙමී ගිය බලු පැටවකු මෙන් හුනස්නෙන් නැගිටගත් ලෙප්ටිනන්ට් සිය හිස්වැසුමෙන් වතුර ඉසින්නට විය.

සෙමි....යානි ..... ව්‍යා...කීර් මර්යුට්කාගේ කටහඬ, අඳුර, සුළඟ හා ඝෝෂාව ඔස්සේ කඩුපහරක් මෙන් දිව ගියේය.

එහෙත් පිළිතුරු නැත.

"අහිංසකයා ගිලිලා!"

අමාරුවට පත් වල්ලම සුළඟේ ආධාරයෙන් වෙරළ කරා ඇදී ගියේය.

"බැහැපන්!"

දණ වටක් දිය බට මර්යුට්කාගේ අණට කීකරු වූ ලෙප්ටිනන්ට් ඈ පසුපස්සේ ගමන් කළේය.

"වල්ලම ගොඩට අදිමු."

මුහුණට වදින දිය පහර නොතකා, නැගීගෙන එන රළ ගෙඩි හා පොරබදිමින් ඔවුන් දෙදනා වල්ලම ගොඩට ඇද්දාහ. මර්යුට්කා රයිපලය අතට ගත්තාය.

"කෑම මලු ගනින්!"

ලෙප්ටිනන්ට් කීකරු විය. වියළි ස්ථානයක් බලා මර්යුට්කා රයිපල් බිම තැබුවාය. ඒ අනුව ලෙප්ටිනන්ට්ද කෑම මලු බිම තැබුවේය.

යළිත් වරක් මර්යුට්කාගේ හඬ අන්ධකාරය ඔස්සේ පැතිර ගියේය.

"සෙමියා...නි... ව්‍යාකීර්..."

පිළිතුරු නැත.

මල්ලක් මත හිඳගත් ඈ ගැහැනියක මෙන් වැළපෙන්නට වූවාය.

ඈ පිටුපසින් නැගිට සිටි ලෙප්ටිනන්ට්ගේ දත් 'කිටි කිටි' යන අනුකරණයෙන් ගැටෙන්නට විය. එහෙත් උරිස් හකුළුවමින් ඔහු "රොබින්සන් කෘසෝ හා ඔහුගේ ප්‍රයිඩේ හිතවතා" යනුවෙන් තොළ මතුළේය.

දෙවැනි පිළිසඳර හා ශීත ජලයේ නැමේ භයානක බව පෙන්නා දීම.

ලෙප්ටිනන්ට් මර්යුට්කාගේ උරිසට අත තැබුවේය. ඔහු යමක් කීමට තැත් කළ නමුත් දත් ගැටීම එය වලකාලූයෙන් අත්ල නිකටට තබා කතා කරන්නට විය.

"අඬලා වැඩක් නැහැ. එහාට මෙහාට ඇවිදින්න ඕනෑ. නැත්නම් අපි ගල්වේවි."

මර්යුට්කා හිස එසෙව්වාය.

"අපි කොහොම යන්නද? මේක දූපතක්. හැම පැත්තෙම වතුර."

ඇගේ කටහඬේ අසරණභාවයක් ගැබ් වී තිබුණි.

"එහෙම වුණත් ඇවිදින්න ඕනෑ. සමහර විට මඩුවක් හෙම තිබෙන්න බැරි නැහැ."

"කොහොමද දන්නෙ?" මීට ඉස්සර මේ පැත්තට ඇවිත් තිබෙනවාද?"

"නැහැ, නමුත්, මා ඉස්කෝලෙ ගිය කාලෙ පොත්වල කියවලා තිබෙනවා. මේ දූපතේ අල්ලන මාළු තැබීමට මසුන් මරන මිනිස්සු මඩු හදන බව. ඒ මඩුවක් හොයා ගන්න ඕනෑ."

"හොඳයි ඒ මඩුවක් ලැබුණොත්, එතකොට?"

"උදේට කල්පනා කර බලමු. නැගිටින්න ප්‍රයිඩේ." මර්යුට්කා භීතියෙන් ඔහු දෙස බැලුවාය.

මේ මනුස්සයට පිස්සු, සිකුරාදා නොවෙයි අද බදාදා."

"ඒකට කමක් නැහැ. මා මොනවා කීවත් ගණන් ගන්න එපා. ඒ ගැන පසුව සාකච්ඡා කරමු. නැගිටින්න."

ඊට කීකරු වූ මර්යුට්කා නැගිට්ටාය. රයිපල් අතට ගැනීමට නැඹුරු වූ ලෙප්ටිනන්ට් දුටු මර්යුට්කා වහා පැන ඔහුගේ අත ඉවතට තල්ලු කළාය.

"සෙල්ලම් බැහැ! පැන යන්නේ නැහැ කියලා ඔබ මට පොරොන්දුවක් දීලා ඇති."

අත ඉවතට ගත් ලෙප්ටිනන්ට් මහා හඬින් සිනාසෙන්නට විය.

මට නොවෙයි පිස්සු. ඔබටයි පිස්සු. මෝඩි, මොලේ පාවිච්චි කරපන්. මෙහිදී මා පැන යන්නේ කොහොමද? මට වුවමනා කළේ රයිපල් බර නිසා එය උස්සාදෙන්න."

මර්යුට්කා ප්‍රබෝධමත් වූවාය.

"උදව්වට බොහොම ස්තූතියි! මට අණ ලැබී තිබෙන්නේ ඔබ මධ්‍යස්ථානයට භාර දෙන්නයි. ඉතින් ඔබගේ අතට රයිපලයක් දෙන්න බැහැ."

දෙඋර හකුළුවා ගත් ලෙප්ටිනන්ට් කෑම මලුත් රැගෙන මර්යුට්කා පසුකොට ගමන් කරන්නට වී.

හිම මිශ්‍ර වූ පස් ඔවුන්ගේ පාවලට යට වී තැලී ගියේය. මේ සමතලා පාළු වෙරළ ඉමක් කොනක් නැති සේ පෙනන්නට විය.

ඈත හිමෙන් වැසී ගිය යම් කිසිවක් ඔවුන්ගේ නෙතට ගොඳුරු විය.

රයිපල් තුනක බර පටවාගෙන ගමන් කළ මර්යුට්කා නොන්ඩි ගසන්නට වූවාය.

"මාරියා පිලටොව්නා, ප්‍රීතියි, අපි එතැනටම ඇවිත් තිබෙන හැඩයි. අර පේන්නේ මඩුවක් වෙන්නට ඇති."

"එහෙමනම් හොඳා. මං ඉවරයි සීතලෙන් දරදඬු වෙලා."

ඒ මඩුවට ඔව්හු රිංගා ගත්හ. අතිශයින් අඳුරු වූ එහි තුළ නාසය කැඩී යන අන්දමේ, හිමෙන් තැම්බී ගිය මාළු ගඳ පැතිර තිබුණි.

මඩුව තුළ අතපතගාමින් ගිය ලෙප්ටිනන්ට්ගේ අත්වලට මාළු ගොඩවල් අසුවිය.

"මාළු! අඩු වශයෙන් කන්න නැතුව නම් මැරෙන්න වෙන්නෙ නැහැ."

"අපට එළියක් තිබුණා නම්! අපට පේනවා නම්, හුළඟෙන් වැළකී ඉන්න මුල්ලක් හොයා ගන්න පුළුවන් වේවි." මර්යුට්කා කෙඳිරිගෑවාය.

"මේ වාගේ තැනක විදුලිය එළිය බලාපොරොත්තු වෙන්න බැහැ."

"මාළු පුළුස්සන්න පුළුවනි. බලන්න හරි තෙල් මාළු." ලෙප්ටිනන්ට් යළි සිනාසුණේය.

"මාළු පුළුස්සන්නෙ? ඔබ ඇත්තෙන්ම ඔල්මාදයෙන්!"

"ඇයි වොල්ගා නදිය අසල අපේ ගමේ නම් ඕනෑතරම් මාළු පුළුස්සනවා. දර කොටවලට වඩා හොඳින් මාළු පිළිස්සෙනවා."

මර්යුට්කා කීවාය.

"මාළු පිළිස්සෙන බව මා මේ පළමු වතාවට ඇසුවා. නමුත් කොහොමද ගිනි තියන්නේ? ගිනි ගලක් නම් මා ළඟ තිබෙනවා. නමුත් පරඬැල්...?

බබෙක් වෙන්න එපා, තාමත් පේනවා ඔබ හැදී තිබෙන්නේ අම්මාගේ ගවුම් කෙළවරේ එල්ලීගෙන බව. මෙන්න මේ පතරොම් කඩන්න. බිත්තිවලින් මම ලී පතුරු ටිකක් ගළ වන්නම්.

ලෙප්ටිනන්ගේ ඇඟිලි සීතලට හසු වී තිබීම නිසා පතුරම් තුනක් ගලවා ඉවත් කිරීම දුෂ්කර කාර්යයක් විය. බිත්තියෙන් ලී පතුරු ගලවාගෙන පැමිණි මර්යුට්කා කළුවරේ ලෙප්ටිනන්ගේ ඇඟේ හැපී වැටෙන්නට ගියාය.

"මෙතනට වෙඩි බේත් දමන්න. කෝ ගිනිගල?"

පාන්කඩයට ඇවුළුණු ගින්දර ලී පතුරුවලට ඇවිලී ගියේය.

"පත්තුවෙනවා. මාළු ටිකක් ගේන්න." මර්යුට්කා ප්‍රීතියෙන් කෑ ගෑවාය.

දැවෙන ලී පතුරු උඩ පේළියට මාළු තැබුණි. මඳක් පිපිරෙමින් තිබී පසුව ලක්ෂණ ගිනිදැල් මාළු වෙලා ගති.

"දැන් තිබෙන එකම වැඩේ කන එකයි! හය මසකටවත් මේ මාළු කාල ඉවර කරන්න බැහැ."

මර්යුට්කා ඈ අවට පරීක්ෂා කළාය. ගිනිමැල පැතිර ගියේය. ලෑලි බිත්ති සිදුරුවලින් යුක්ත විය.

ඈ මඩුව පරීක්ෂා කිරීමේ යෙදුණාය.

"මේ මුල්ලේ හිල් නැහැ. ගින්නට මාළු දමන්න ඕනෑ. ඒක නිවෙන්න හරින්න එපා. මා මෙතන පිරිසිදු කරන්නම් ජීවත්වෙන්න පුළුවන් හොඳ තැනක් සූදානම් කරන්නම්."

ගිනි මැලය අසල වාඩි වී සිටි ලෙප්ටිනන්ට් ගිනි රස්නය සිරුර තුළට වදින විට උරිස් හකුලුවමින් සිටි අතර මර්යුට්කා මාළු ඒ මත අත දමමින් වැතිර ගැනීමට සුදුසු සේ මුල්ල පිළියල කළාය.

"ඔක්කොම හරි, එළියක් ගේන්න." ඈ අවසානයේ දී කීවාය.

ගින්නෙන් දැවෙන මසකු වලිගයෙන් ගත් ලෙප්ටිනන්ට්, මර්යුට්කා සිටි තැනට ළං විය. අඩි හයක් පමණ ප්‍රමාණයෙන් වටකොට මර්යුට්කා තුන් පැත්තක මාළු අඩුක්කොට තිබුණි.

"මෙහාට ඇවිත් තවත් ගිනි මැලයක් අවුලන්න. මම අපේ මෙවලන් ටික ගේන්නම්."

ලෙප්ටිනන්ට් දැවෙන මාළුවා අනිත් මාළු ගොඩකට අල්ලා තවත් ගිනි මැලයක් මෙළවීය. මෙවලන් ගෙනා මර්යුට්කා රයිපල් බිත්තියට හේත්තුකොට තබා මලු බිම තැබුවා ය.

"මළඉලව්වේ, අර දෙන්නා ගිලුණේ අහවල් දේකට ගිහිල්ලද?"

"අපේ තෙත ඇඳුම් වේලාගන්න ඕනෑ. නැත්නම් හෙම්බිරිස්සාව හැදෙන්න පුළුවනි." ලෙප්ටිනන්ට් කීවේය.

"ඉතින් මොකද නොකර ඉන්නෙ? දැන් ගින්දර හොඳට දැවෙනවා. ඇඳුම් ගලවලා ඒවා වේලා ගනිමු.

ලෙප්ටිනන්ට් ලජ්ජාවෙන් නළියන්නට විය.

"මාරියා පිලටොව්නා ඔබගේ ඇඳුම් කලින් වියළා ගන්න" මා එළියට වී ඉන්නම්. මගේ ඇඳුම් පසුව වේලා ගන්නම්.

සීතලෙන් ගැහෙන ලෙප්ටිනන්ට්ගේ මුහුණ මර්යුට්කාගේ කරුණාවන්ත නෙතට ගොදුරු විය.

"ලෝකයේ මෝඩයෙක් හිටියා නම් ඒ ඔබ තමයි. මොකටද බය වුණේ? ඔබ කවදාවත් හෙළුවැලි ගැහැනියක් දැකලා නැද්ද?"

"නැහැ. ඒ ගැන නොවෙයි. මා හිතුවා මා සිටිය දී ඔබට.."

"බොෂ්! අප සෑදී තිබෙන්නේ එකම මස්වලින් හා ලේවලින්, මෝඩයා, ඔය තෙත ඇඳුම් ගලවනවා. ඔබේ දත් මැෂින් තුවක්කුවක් වගේ හැපෙනවා. මම ඔබව නටවන්නම්!" ඈ කෑගෑවාය.

රයිපල් උඩින් එල්ලා තැබූ තෙමුණු රෙදිවලින් වාෂ්ප නගින්නට වී. මර්යුට්කා සමින් කරන ලද සැට්ටයක් උරිස් මත දවටා ගත්තාය.

"ඇළවෙන්න වෙලාව, හෙට උදේ වෙන විට කුණාටුව සංසිඳේවි. බෝට්ටුව ගිලුණේ නැත්තේ අපේ වාසනාවට. මුහුද සංසිඳුනොත් සුර්දර්යා තෙක් යන්නට පුළුවනි. එහිදී පන්නකරුවන් හමුවේවි. හාන්සිවෙන්න. මම ගින්න මොලවන්නම්. මට නිදිබර වූ වහාම මා ඔබ නැගිටුවන්නම්. වාරෙන් වාරෙට ගින්න මොළවමු."

යටට දැමූ ඇඳුම් උඩ වැතිර ගත් ලෙප්ටිනන්ට් ඒ මත හාන්සි වී කබායෙන් සිය සිරුර වසා ගත්තේය. විඩාව නිසා තදින් නිදන්නට වූ ලෙප්ටිනන්ට් ගොරවන්නට විය. ඇසිපිය නොහෙළා එදෙස බලා සිටි මර්යුට්කා, දෙවුර හැකුළුවාය.

හරිම වැඩේ! මිනිහට සනීප නැති හැඩයි. හෙම්බිරිස්සාව හැදුනොත්? ගෙදර නම් විලූද උඩ ඉන්න ඇති. හත්ඉලව්වයි!"

"මෝඩයා, ඔය තෙත ඇඳුම් ගලවනවා.
ඔබේ දත් මැෂින් තුවක්කුවක් වගේ හැපෙනවා."

අලුයම හිරු එළිය සිදුරු අස්සෙන් එබී බලන්නට වූ වේලාවේ දී මර්යුට්කා ලෙප්ටිනන්ට් අවදි කළාය.

"ගින්න බලාගන්න. ඇහුණද? මම වැල්ලට ගිහින් අපේ මිනිස්සු ගොඩට පැනලා දැයි බලා එන්නම්."

ලෙප්ටිනන්ට් අමාරුවෙන් නැගිට්ටේය.

"මට හිසේ ඇම්ම." හිස අල්ලාගත් ඔහු කීය.

"ඒක වෙන්න පුළුවන්. දුමෙන් හා විඩාවෙන්. ඒක හොඳ වේවි. මල්ලෙන් මොනවා හරි අරගෙන මාළුත් එක්ක කන්න."

රයිපලය අතට ගත් මර්යුට්කා එය තම සැට්ටයෙන් පිස දා මඩුවෙන් පිට වී වෙරළ දෙසට ගියාය.

මල්ලේ තිබුණු කිසිවක් ගෙන ගිනිමැලය අසලට ඇදුණු ලෙප්ටිනන්ට් එය හපා විසිකොට ගින්න අසල සිහිනැතිව වැතිර ගත්තේය.

මර්යුට්කා ලෙප්ටිනන්ට් උරහිසින් අල්ලා සෙලෙව්වාය.

"නැගිටින්න, අපි සුන්! වල්ලම ගසාගෙන ගිහින්! අපි විනාශයි!"

කිසිත් නොබැණ ලෙප්ටිනන්ට් ඈ දෙස හිස් බැල්මෙන් බලාගත්වනම සිටියේය.

ලෙප්ටිනන්ට් දෙස බැලූ මර්යුට්කා සුසුමක් හෙලුවාය.

ලෙප්ටිනන්ට්ගේ අතිශයින් නීලවර්ණ වූ ඇස්වල පාළු පෙනුමක් තිබුණි. ඇගේ අත්ල මත තිබුණු කම්මුලෙන් ගිනි පිටෙවන්නා සේ දැනුණි.

"හෙම්බිරිස්සාව හදාගත්තා! පඹයා දැන් ඉතින් මොනවා කරන්නද?"

ලෙප්ටිනන්ට්ගේ තොල් විවර විය.

මර්යුට්කා නැඹුරු වූවාය.

"මීකයිල් අයිවනොවික්, මට නරක ලකුණක් දෙන්න එපා. මට එය ඉගෙන ගන්න බැරිවුණා... මා එය හෙට සූදානම් කරන්නම්."

"මොනවද මේ දොඩවන්නේ?" මඳක් තැතිගත් මර්යුට්කා ඇසුවාය.

"බලාපන් කොස්සා.." නැගිට ගත් ඔහු කෑ ගැසුවේය.

පස්සට පැන්න මර්යුට්කා දෙඅතින් මුහුණ වසා ගත්තාය.

ලෙප්ටිනන්ට් යළිත් ඇද වැටුණි. දොඩවන්නට වූ හෙතෙම ඇඟිලි තුඩින් පස් හාරන්නට විය.

මර්යුට්කා ඔහු වෙත වියරු බැල්මක් හෙළුවාය. සැට්ටය ගලවා බිම දැමූ ඇය ලෙප්ටිනන්ට් ඇද ඒ මත දමා කබායෙන් වැසුවාය. අනතුරුව ලෙප්ටිනන්ට් අසල වාඩි ගත් ඇගේ දෙකොපුල් කඳුළින් තෙමී ගියේය.

හිටිහැටියේ ලෙප්ටිනන්ට් කබාය විසි කළ නමුත් මර්යුට්කා යළි යළිත් එය රැගෙන පෙරවූවාය.

ඔහුගේ හිස බිම වැටුණු සෑම විටෙකම මර්යුට්කා එය කෙළින් කර තැබුවාය. ඇස් කරකවා ගත් ඈ දෙවියන්ට කියන්නාක් මෙන් තොල මතුළාය.

"මැරෙන්න පුළුවනි. එවිට යෙව්සුකොප්ට මොනව කියන්නද? දෙවියනේ! දෙවියනේ! දෙවියනේ!

ඔහුගේ සිරුර වෙත නැඹුරු වූ ඈ ඔහුගේ නිල්වන් නෙත් සඟල දෙස බැලුවාය.

කරුණාවේ පිහි පහරින් ඇගේ හදවත සිදුරු විය. ඈ හෙමිහිට ඔහුගේ හිස පිරිමදින්නට වූවාය. ඔහුගේ හිස පස්සට ගත් මර්යුට්කා කරුණාවෙන් පිරී ගොස් තොල මතුළාය.

"මෝඩ මනුස්සයා."

මුලදී අවුල් වූ නමුත් පසුව පැහැදිලි වෙයි.

මිනිගෙඩිවලින් යුත් හොරණෑ හඬ නැගෙයි. මිනි ගෙඩිවලින් හඬ නැගෙයි.

"ටිං - අ - ලිං - අ - ලි!"

"ටිං-අ-ලිං-අ-ලිං"!

"ටූට්-ටූට්-ටූට්-ටූට්" හොරණෑ හඬ නගයි. හමුදා පෙළපාළියක්. ඒ ගැන ප්‍රශ්න ඕනෑ නැහැ. පෙළපාළියක්. ඇඳුම් සන්දර්ශනවල දක්නා ලැබෙන පෙළපාළියක්.

මේපල් ගස් අතරින් වැටුණු හිරු රශ්මියෙන් යුක්ත එම චතුරස්‍රයමයි.

බෑන්ඩ් කණ්ඩායමේ නායකයා කණ්ඩායම මෙහෙය විය. ඔහුගේ දිග කබායේ සිදුරකින් විශාල නරි වළිගයක් පිටතට වැටී ඇත. ඒ කෙළවරෙහි රත්තරං බෝලයක් විය. එහි තුළ ශබ්ද පරීක්ෂණයක් තිබුණි.

වළිගය පැත්තෙන් පැත්තට හැරවෙන්නේය. සංගීත භාණ්ඩවලට තාලය සපයන එය කුඩා හොරණෑවලට හා ලොකු හොරණෑවලටද සංගීතය ඇරඹීමට අණකරයි. වාදකයකු අලස බව පළකරමින් ඇඟුම් හරින විට මේ වළිගය ඒ වාදකයාගේ නළල මත පතිත වේ.

සංගීතඥයෝ මැනවින් වාදනය කළහ. ඔව්හු ප්‍රීතිය ගෙන දෙන සංගීතඥයෝ වූහ. සාමාන්‍ය සොල්දාදුවෝ නොයෙක්

රෙජිමේන්තුවලින් පැමිණි ආරක්ෂක භටයෝ. හමුදා බෑන්ඩ් කණ්ඩායම.

එහෙත් සංගීතඥයෝ ගී ගායනය නොකළහ. එක සංගීතඥයකුවත් කට ඇරියේ නැත. හොරණෑ සියල්ල. වම් නාසාපුට තුළට රුවා තිබුණි.

දකුණු නාස් පුටයෙන් හුස්ම ගත් ඔව්හු වම් නාස් පුටයෙන් පිට කළහ. ඒ නිසා හොරණෑවලින් වූ නාදය අතිශයින් කර්ණරසායන විය.

"ටෙන්-ෂුන් සංගීතය පටන් ගන්න!"

"තුවක්කු උරිස් මත තබනු!"

"රෙජිමේන්තු!"

"සේනාංකය!"

"කණ්ඩායම!"

"සේනාංක එක -පෙරට යනු!"

හොරණෑ : "ටූට් -ටූට්" සීනු : "ටිං-අ-ලිං-අ-ලිං" කපිතන් ෂ්ටේවට්සොප් පනිමින් ඉදිරියට ගමන් කරයි. ටැප්-ටැප්-ටැප්.

"නුඹලා හොඳ හාදයෝ!"

"ට්ටීඩ්ල් ඩම්, ට්වීඩ්ල් ඩී!"

"ලෙප්ටිනන්ට්!"

"ලෙප්ටිනන්ට්, ජෙනරාල් ලෙප්ටිනන්ට් අමතයි!"

"මොන ලෙප්ටිනන්ට්ද?"

"සේනාංක තුනෙන්. ලෙප්ටිනන්ට් ගොවොරුකාඕට්‍රොක්ට කතා කරනවා!"

චතුරශ්‍රය මැද තුරඟකු පිට ජෙනරාල් සිටියි. ඔහුගේ මුහුණ රතුය. උඩු රැවුල සුදුය.

"මේ මනස්ගාතවල තේරුම් කුමක්ද? ලෙප්ටිනන්ට්?"

"හා හා! හෝ හෝ! හි හි!"

"ඔබට පිස්සුද? ඔබ හිනාවෙන ආකාරය? මම.. මම... ඔබ මේ කතා කරන්නේ කාටදැයි දන්නවාද?"

"හා -හා! හි- හි! ඔබ ජෙනරාල් නොවෙයි. ඔබ බළලෙක්!"

. චතුරශ්‍රය මැද අසකු පිට නැගී ජනරාල් සිටී. ඔහුගේ ඉඟටිය තෙක් ඔහු ජෙනරාල් කෙනෙකි. අනෙක් භාගය පූසෙකි. ඒත් හොඳ බළලෙක් නොවේ. සාමාන්‍ය කළු-සුදු බළලෙක්. ඒ විදියේ බළල්ලු පිළිකනුවල ඉන්නවා.

ඔහු සිය ගාත්වලින් සෑදැලයේ පය තබා වළලු අල්ලා ගනී.

"ලෙප්ටිනන්ට්, මා ඔබ යුද්ධ අධිකරණය වෙත පමුණනවා. ඇහුණේ නැද්ද? ආරක්ෂක භටයෙක් නිලධාරියෙක්. ඔහුගේ අතුනු බහන් පේනවා!"

පහත බැලූ ලෙප්ටිනන්ට් ක්ලාන්ත භාවයට පත් විය. ඇත්තකි. ඔහුගේ අතුණුබහන් පෙනෙන්නේය. ඔහු එය අල්ලා ගත්තේය. එහෙත් මිටින් ලිස්සා යයි.

"ඔහුගේ පොරොන්දුව කඩ කළා. ඔහු හිරභාරයට ගනු!"

සෑදලයේ පය තබන වළල්ලෙන් එක කකුලක් එළියට ගන්නා ජෙනරාල් එහි නිය විදහා ලෙප්ටිනන්ට් අල්ලා ගැනීමට තැත්කරයි.

ඒ කකුලේ ඇසක් සහිත සන් කටුවෙක් වෙයි.

එය සාමාන්‍ය ඇසකි. රවුම් කහ පැහැති එය ලෙප්ටිනන්ට්ගේ හදවත කරා වදී.

ලයාන්විත ලෙස ඉඟි මැරූ ඒ ඇස කතා කරන්නට පටන් ගනී. ඇසක් කතා කරන්නේ කෙසේදැයි කිසිවෙක් නොදනී. එහෙත් එය කතා කළේය.

"භය වෙන්න එපා, භය වෙන්න එපා. ඔබට දැන් සනීපයි" ඇය පළ කළාය.

ලෙප්ටිනන්ට්ගේ හිස අතකින් ඔසවන ලදී. නාගරික පන්නයට කපන ලද කෙස් වැටියකින් යුක්ත කුඩා හිසක් ඔහු

දුටුවේ ය. කෙස් රැල්ලක් ඇස් මත වැටී තිබුණි. ඒ සන් කටුයේ වූ ඇස වැනි සානුකම්පික බැල්මකින් යුත් කහ පැහැති ඇසකි.

"අනේ අහිංසකයා, ඔබ මා කොතරම් බිය කළාද? මුළු සතියක් තිස්සේ මා ඔබට සාත්තු සප්පායම් කළා. මා සිතුවා ඔබ ඉවරයි කියා. මේ දූපතේ අපි තනි වුණා. බේතක් හේතක් නැහැ. උණු වතුර පමණක් පොව පොවා මාත් හිටියා. ඉස්සෙල්ලා ඔබ එය විසි කළා. මඩ වතුර, ලුණු රසයි. එය බඩට අල්ලන්නේ නැහැ."

ඉතා අමාරුවෙන් ලෙප්ටිනන්ට් මේ ලයාන්විත මෘදු වචන අල්ලා ගත්තේය.

අමාරුවෙන් හිස එසවූ ඔහු අප්‍රාණික ඇසින් වටපිට බැලුවේය.

හැම තැනම මාළු ගොඩවල්. ඇවිලෙමින් තිබෙන ගිනි මැලය. කරුවකින් එල්ලෙන කේතලය. නටන වතුර!

"මේ මොකද? මා මේ ඉන්නේ කොහේද?"

"ඔබට මතක නැද්ද ඔබ මා හඳුනන්නේ නැද්ද? මර්යුට්කා"

ලෙප්ටිනන්ට් සිය නළල්තලය පිරිමැද්දේය. මතක් කරමින් ඔහු මන්දස්මිතයක් පළ කළේය.

"ඔව් හරි. රොබින්සන් හා ප්‍රයිඩේ."

"අයියෝ, යළිත් සිහිය නැහැ. ඒ ප්‍රයිඩේ ඉන්නේ ඔබේ ඔළුවේ. මම දන්නෙ නැහැ අද කවදද කියල. මට මතක තියාගන්න බැරිවුණා."

ලෙප්ටිනන්ට් යළි සිනාසුණේය.

"මා කියන්නේ දවස ගැන නොවේ. එය නමක්. නැවක් දියබත් වීමෙන් පසු දූපතක ජීවත් වූ මිනිසකු ගැන කතාවක් තිබෙනවා. එය ඔබ කවදාවත් කියවා නැද්ද?"

කබාය මත වැතිර ගත් ඔහු කහින්නට විය.

"නැහැ. මා බොහෝ කතා පොත් කියවා තිබෙනවා. නමුත් ඔය කතාව කියවලා නැහැ. හාන්සි වෙන්න. හෙළ

වෙන්න එපා. නැත්නම් නැවත අමාරු වෙයි. මම මාළු ටිකක් තම්බන්නම්. යළි කෑම කන්න පුළුවන් වුණාම ඇඟට පණ ඒවි. මුළු සුමානෙ තිස්සෙම වතුර හැර වෙන මොනවත් ඔබ කෑවේ නැහැ. කොතරම් කෙට්ටු වෙලාද? බඩ බොකු පේනවා. හාන්සි වෙන්න."

ලෙප්ටිනන්ට් දුර්වල ලෙස දෙඇස් පියා ගත්තේය. ඔහුගේ හිස සීනු ශබ්දයෙන් පිරී ගියේය. හොරණෑ හඬ යළිත් මතක් වී හිනා පහළ විය.

"ඒ මොකද?" මර්යුට්කා ප්‍රශ්න කළාය.

"විශේෂ අමුත්තක් නැහැ. මා සිහිනැතිව සිටි කාලයේ දුටු සිහිනයක් මතක් වුණා."

"ඔබ අඬමින් හිටියා. අණදුන්නා. දිව්රුවා. එහෙම වැඩක්! ඇඟ ලොමුදැහැ ගන්වන සුළඟ! මනුස්ස පුළුටක් නැහැ. අප දෙදෙනා පමණයි. ඔබත් පිස්සෙක්. මට බය හිතෙන්නේ නැද්ද?" ඈ මඳක් තිගැස්සුණාය. "මොනවා කරන්නදැයි සිහි එළවාගන්න බැරිවුණා!"

"ඉතින් කොහොමද කටයුතු කළේ?"

"මටත් කියාගන්න බැහැ. මට හැබෑටම බිය හිතුණා. ඔබ සාගින්නේ මැරේය කියා. වතුර මිස වෙන කිසිවක් දෙන්න තිබුණේ නැහැ. ඒ හැරුණාම මාළු පමණයි. ලෙඩකුට ලුණු මාළු? ඔබට සුවවීම මට ප්‍රීතියක් නොවේද?"

ලෙප්ටිනන්ට් අත දිගුකර මර්යුට්කාගේ අත මත තැබුවේය.

"බොහොම ස්තූතියි මර්යුට්කා." ඇගේ අත හෙමිහිට පිරිමදිමින් ඔහු කීවේය.

මුහුණ රතු වූ ඈ අත ඉවතට ඇදගත්තාය.

"මට ස්තූති කරන්න එපා! එය ස්වාභාවික සිද්ධියක්. මිනිසකු මිය යන්නට හැරීමට තරම් මා මෘග නැහැ."

"නමුත් මා ඔබට හතුරු වූ නිලධාරියෙක්. ඔබ මා ගලවා ගැනීමට කැදර වූයේ ඇයි? ඔබත් අඩක් මැරිලා."

අවිනිශ්චිත මොහොතක් උදාවිය. එහෙත් මර්යුට්කා තමා තුළ පැන නැගී ගැටලුව සීන් සිනාවකින් හා අත වැනීමෙන් අමතක කළාය.

"හතුරෙක් - ඔබ? ඔබට ඇඟිල්ලක්වත් ඔසවන්න බැහැ. අගේ ඇති හතුරා! මේ මගේ ඉරණම. මා හිතනවා. එක පාරින්ම මට ඔබට වෙඩි තියාගන්න බැරිවුණා. ඒ මගේ ජීවිතයේ පළමුවරට ඉලක්කය වැරදුණා. එයින් පේනවා ඔබ සමග අවසානය දක්වා කරදර වෙන්න මගේ කරුමය තිබුණු බව. මෙන්න මේක කන්න."

ඈ මාළු බඳුනක් ඔහු වෙත ළං කළාය.

ලෙප්ටිනන්ට් මාළු කූරියා එළියට ගෙන කෑවේය.

"හරියට ලුණු. උගුර පිළිස්සේවි."

"කරන්න දෙයක් නැහැ. හොඳ වතුර තිබෙනවා නම් ලුණු සෝදා හරින්න පුළුවනි. ලුණු මාළුයි, ලුණු වතුරයි. හත්ඉලව්වයි."

ලෙප්ටිනන්ට් බඳුන ඉවත් කළේය.

"මොකද ඇතිද?"

"එපා ස්තුතියි. ඔබත් කන්න."

"මම? මම සතියක් තිස්සේ කෑවේ ඒවා තමා. තවත් ඉතින් බැහැ."

ලෙප්ටිනන්ට් වැලමිටි, බිම ඔබා මඳක් කෙළින් වී සිටියි.

"දුමක් උරන්න තිබුණා නම්!" ඔහු කීය.

"දුමක්? ඇයි ඉතින් නොකීවේ? සෙමියනිගේ මල්ලෙ තිබුණා දුම්කොළ වගයක්. මා ඒවා වේලා තැබුවා. මා හිතුවා ඔබට ඒවා ඕනෑ වෙන බව. මෙන්න."

ලෙප්ටිනන්ට් තුළ කාරුණික හැඟීමක් පහළ විය. සැලෙන ඇඟිලි තුඩින් ඔහු දුම්කොළ ටික ගත්තේය.

"මර්යුට්කා ඔබ මැණිකක්! සාත්තු සේවිකාවකට වඩා හොඳයි.

"ඔබ වැනි මිනිසුන්ට සාත්තු සේවිකාවන් නැතිව බැහැ." කී මර්යුට්කාගේ මුහුණ යළිත් රතු විය.

"සිගරට්ටුවක් ඔතාගන්න කඩදාසි කෑල්ලක් නැහැනේ! ඔබේ නායකයා මා ළඟ තිබුණු කඩදාසි සියල්ල අරගත්තා."

"මගේ පයිප්පයත් නැතිවෙලා!"

"කඩදාසි!" මර්යුට්කා කල්පනා කරන්නට වූවාය.

තීරණාත්මක බලාපොරොත්තුවකින් ලෙප්ටිනන්ට්ගේ දණිස මත තිබුණු සිය කබාය අතට ගත් මර්යුට්කා, එහි පේටකයක් තුළ තිබුණු කඩදාසි මිටියක් අතට ගත්තාය. එහි බැම්ම මුදාලූ ඈ කඩදාසි කැබලි කිහිපයක් ඔහු අතට දුන්නාය.

"මෙන්න කඩදාසි."

ඒ කඩදාසි කැබලි අතට ගත් ඔහු එදෙස බලාගෙන සිටියේය. අතුරුව ඔහු මර්යුට්කා දෙස බැලුවේය. ඔහුගේ නෙත්වලින් සංත්‍රාසයක් පළ විය.

"මේ ඔබේ කවි නේද? ඔබට පිස්සුද? මට ඕව එපා."

"කමක් නැහැ. මළ හත්ඉලව්වයි! මට තවත් දුක් දෙන්න එපා." මර්යුට්කා කෑගෑවාය.

ලෙප්ටිනන්ට් ඈ දෙස බැලුවේය.

"ස්තුතියි, මර්යුට්කා, මට මෙය අමතක වෙන්නෙ නැහැ."

කඩදාසි කෙළවරක් ඉරා ගත් ඔහු එයින් සිගරට්ටුවක් ඔතාගෙන දැල්ලුවේය. අනතුරුව දුම් ගුළි නංවන්නට වූ ඔහු හාන්සි වී හිස් අවකාශය දෙස බලාගෙන සිටියේය.

ඔහු දෙස ඕනෑකමින් බලාගෙන සිටි මර්යුට්කා හදිසියේම කතා කළාය.

"මට තේරුම් ගන්න බැරි එක කාරණයක්. ඔය ඇස් ඔතරම් නිල්පාට වූයේ ඇයි? මම නම් මගේ ජීවිතේ ඔතරම් නිල්පාට ඇස් දැකලා නැහැ. ඔය නිලෙහි කිමිදෙන්න පුළුවනි."

"මා දන්නෙ නැහැ. මට ඒවා උත්පත්තියෙන්ම ලැබී තිබෙනවා. බොහෝ දෙනෙක් ඒවායේ අස්වාභාවික වර්ණයක් තිබෙන බව මා සමග කීවා." ලෙප්ටිනන්ට් කීවේය.

"ඒක ඇත්ත. මේ ඇස් මෙහෙම වී තිබෙන්නේ මන් දැයි ඔබ සිරහාරයට ගත් වේලේ සිට මා කල්පනා කළා. ඔය ඇස් අනතුරු සහගතයි. ඕවා, ඕවා අනතුරු සහිතයි."

"කාටද?"

"ගැහැනුන්ට! කාටත් හොරෙන් ඔය ඇස් උන් ඇතුළට වදිනවා. එයින් උන් කුල්මත් වෙනවා."

"ඔබටත් එසේ වුණාද?"

මර්යුට්කා නලියන්නට වූවාය.

"ඔය තරම් ඉව අල්ලන්න එපා! ඔබේ ප්‍රශ්න තමන්ටම කියාගන්න. මා වතුර ගේන්න යනවා."

බාල්දිය ගත් ඈ මාළු ගොඩෙන් එහා පැත්තට යමින්, "නිල් ඇස් මෝඩයා," යි කීවාය.

මේ සම්බන්ධයෙන් විග්‍රහයක් අනවශ්‍යය.

මාර්තු ගුවන! වසන්ත සුළඟ! ඇරල් මුහුද මත නීල වර්ණ විල්ලුද පලස මත මාර්තු සූර්ය රශ්මිය! එයින් සිරුර පිරිමැදෙයි. උණුසුම් කුඩා දත්වලින් සිරුර විකයි. එයින් රුධිරය උණුසුම් වෙයි.

දැන් ලෙප්ටිනන්ට් සුව වී තෙදිනක් ඉක්ම ගොස් ඇත.

මඬුවෙන් පිට එළිමහනේ හිඳගන්නා ඔහු, සූර්ය රශ්මියෙන් සිරුර තවා ගනිමින්, නිල් මුහුද මෙන් නීල වර්ණ වූ ඇස්වලින් අවට ප්‍රදේශය උරාගෙන බොන්නේය.

මේ අතර මර්යුට්කා දිවයින ගැන සොයා බැලුවාය.

අවසාන වරට ඈ ගිය සවාරියෙන් ප්‍රමුදිතව පෙරළා පැමිණියේ මළ හිරු බසින වේලාවේය.

"හෙට අපි මෙතැනින් යනවා." ඈ කීවාය.

"කොහාටද?"

"එහාට. මෙතැන සිට වර්ස්ට් අටක් විතර එහාට."

"එහෙ මොනවද තියෙන්නෙ?"

"මාළුකාරයන්ගෙ ගෙයක්. මාළිගාවක් වගෙයි! උණුසුම්, ශක්තිමත් ජනෙල්වලට වීදුරු අල්ලා ගෑස් ලිපක්. බිඳුණු පිඟන් කෝප්ප. ඒවා හරි ප්‍රයෝජනයි. ඒ සේරටම වඩා නිදාගන්න පුංචි

ඇඳක් තිබෙනවා. තවත් අපි බිම පෙරලෙන්නෙ නැහැ. මුලින්ම එහි ගියා නම්!

"අපි ඒ ගැන දැන හිටියේ නැහැ."

"ඒක නේන්නම්. මට තවත් දෙයක් හමුවුණා. පුදුම හමුවීමක්."

"මොනවද?"

"ගෑස් ළිප පිටුපස්සේ කෑම වගයකුත් තිබුණා. මා හිතනවා. එහෙ තමයි. මාළුකාරයො කෑම තියන්නෙ. ඉතිරි ඒව එහෙ දාල යන්න ඇති. හාල් ටිකක් සහ පිටි පූඩ් බාගයක් පමණ. ටිකක් පිනිබාලා තියෙනවා. නමුත් කන්න පුළුවනි. සමහර විට කුණාටුවක් එන ලකුණු දැකලා ඒවත් දාලා යන්න ඇති."

පසුවදා උදෑසන ඔව්හු ඔවුන්ගේ නව නවාතැන කරා පිටත් වූහ. ඔටුවකු මෙන් බර පටවා ගත් මර්යුට්කා පෙරමුණ ගමන් කළාය. ඈ ලෙප්ටිනන්ට් බර උසුලාගෙන යාමෙන් වැළැක්වූවාය.

"වෙහෙස වෙන්න එපා. මහන්සි වූවොත් යළිත් අසනීප වේවි. භයවෙන්න එපා. මට පුළුවනි. කටුවයි හමයි වුණාට. මට ශක්තිය තියෙනවා."

මද්දහනය වෙන විට ඔව්හු නව නවාතැන කරා ළං වූහ. එළිපත අසල පිරී තිබුණු හිම ඉවත්කර දොර පලුව යළිත් වැද්දූහ. මාළු පිර වූ උඳුන මොළවා ඒ ගින්නෙන් සිය සිරුරු තවන්නට පටන් ගත්හ. ඔවුන්ගේ මුහුණුවල ප්‍රීතිය උතුරා ගියේය.

"හරි හොඳයි නැද්ද? මේක තමා ජීවිතය."

"මර්යුට්කා ඔබ මහා පුදුමයක්. මගේ මුළු ජීවිතයෙන්ම මා ඔබට කලගුණ සලකනවා. ඔබ නොසිටියා නම් මා මැරෙනවා."

"ඔව් ඇත්තෙන්ම කිරි බබා."

උඳුන වෙත අත් ළං කළ ඈ ඒවා ගින්නෙන් තවා ගත්තාය.

"රස්නය නම් තිබෙනවා. දැන් ඉතින් කරන්නෙ මොකද?"

"බලා හිඳිමු. වෙන මොනවද?"

"මොනව බලා ඉන්නද?"

"වසන්තය තව වැඩි කාලයක් නැහැ. දැන් මාර්තු මැද. තව සුමානෙකින් දෙකකින් මාළුකාරයො ඒවි. උන් අපව ගළ වා ගනීවි."

"එහෙම වුණොත් හොඳයි. මේ මාළුයි පිනි බෑ පිටියි කකා වැඩි කලක් අපට මෙහි ගත කරන්න වෙන්නෙ නැහැ. තව සුමාන දෙකකින් අපිට... හත් ඉලව්වයි!"

"ඔබ හැම තිස්සෙම කියන ඔය හත් ඉලව්ව මොකක්ද?"

"ඇස්ට්‍රකාන්වලදී අපේ මාළු මරණ මිනිස්සු හැම කෙනෙක්ම ඒක කියනවා. ඒක නිකම් දිවිරිල්ලක් වගේ. කැත වචන කියන්න මා කැමැති නැහැ. නමුත් මට තරහ ගියාම මොනවා හරි කියන්න ඕනෑ. මම ගෑස් පිටකරන්නෙ එහෙම තමයි."

උඳුන මත තිබුණු මාළු හැළිය ඈ හැඳිගෑවාය.

"ඔබට මතකද ඔබ කීවා දූපතක් ගැන කතාවක් දන්න වග? ප්‍රයිඩේ ගැන. ඔතන නිකම් බුම්මාගෙන ඉන්නෙ නැතුව ඒ කතාව කියන්න. මා කතා අහන්න හරි ආසයි!"

ගමේ ගෑනු අපේ නැන්දගේ ගෙදරට ඇවිත් මහලු ගුග්නිකාගෙන් කතන්දර අහනවා. ඈට වයස අවුරුදු සීයක් විතර ඇති. නැපෝලියන් මතකලු. මුල්ලකට වෙන මා හුස්ම ගන්නෙ නැතිව අහගෙන ඉන්නවා."

"ඔබට ඕනෑ රොබින්සන් කෘසෝ ගැන අහන්නද? මා එය කියවලා දැන් බොහොම කල්, බාගයක් පමණ මතක නැහැ."

"මතක් කරන්න. මතක තියෙන හරිය කියන්නකො"

"හොඳයි බලමු."

අඩක් ඇස් පියාගත් ලෙප්ටිනන්ට් මතක අතපත ගාන්නට විය. කුඩා ඇඳ මත බැටලු හම් කබාය අතුරා ඊ මත මුල්ලකට වී මර්යුට්කා කතාවට කන් දීමට වූවාය

"මෙහාට ඇවිත් මෙහෙන් ඉඳගන්න. මේ මුල්ලෙ උණුසුම වැඩියි." ඈ ලෙප්ටිනන්ට් අමතා කීවාය.

ලෙප්ටිනන්ට් ඈ අසලින් වාඩි ගත්තේය. ගින්නෙන් ගත පිනවන උණුසුමක් නිකුත් විය.

"ඉතින් පටන් ගන්නේ නැත්තේ ඇයි? මට බැහැ බලා ඉන්න. කතාවකට වැඩිය මා කැමැති තවත් දෙයක් නැහැ."

"නිකට අත්ලෙහි රුවාගත් ලෙප්ටිනන්ට් කතාවට මුල පිරුවේය.

"එක්තරා කාලයක ලිවර්පූල් නගරයේ පොහොසත් මිනිහෙක් හිටියා. එයාගේ නම රොබින්සන් කෘසෝ..."

"කොහේද ඒ නගරය?"

"එංගලන්තයේ, මා කීවේ පොහොසත් මිනිහෙක් හිටියා. එයාගේ නම..."

"පොඩියක්, ඔබ කියන්නේ එයා පොහොසත්? මොකද? මේ සේරම කතා පොහොසතුන් ගැන. කුමාරවරු කුමාරිකාවො ගැන විතරක්? මොකද දුප්පත් මිනිස්සු ගැන කතන්දර කියන්නෙ නැත්තෙ?"

"මා දන්නෙ නැහැ. මා කවදාවත් ඒ ගැන කල්පනා කළේ නැහැ." ලෙප්ටිනන්ට් කීවේය.

"මා හිතනවා එහෙම වී තිබෙන්නේ පොහොසත් මිනිස්සුම තමන් ගැන කතා හදන නිසා වෙන්න ඇති. හරියට මා වාගේ. මට ඕනෑ කවි ලියන්න. නමුත් මට ඉගෙනීමක් තිබුණා නම් මා කවි ලියන්නේ දුප්පත් මිනිස්සු ගැන. හොඳයි කවදාහරි ඉගෙනගෙන ඒවා ලියන්නම්."

"ඉතින් මේ රොබින්සන් කෘසෝ නැවක නැගී ලෝකය වටේ යන්නට අදහස් කළා. ඔහුට ආසාවක් උපන්නා අනෙක් මිනිස්සු ජීවත් වෙන අන්දම බලන්න. ඉතින් දවසක්දා එයා විශාල රුවල් නැවකින් පිටත් වුණා..."

කන්කළු හඬකින් උඳුන ඇවුන අතර ලෙප්ටිනන්ට් කතාව දිගටම කියාගෙන ගියේය.

ටිකෙන් ටික කතාව මතක් විය. ඉතා සියුම් විස්තර පවා මතක් විය.

ත්‍රාසය අන්තර්ගත තැන් ඇසුණු විට හුස්ම හෙළන මර්යුට්කා හුස්ම නොගෙන කතාවට කන්යොමා සිටියාය.

නැව මුහුදුබත් වීම ගැන ලෙප්ටිනන්ට කළ විස්තරය අසමින් මර්යුට්කා දෙවුර හැකුළුවාය.

"එයා හැර අනෙක් හැම දෙනාම ගිලුණා?" ඈ මවිතයෙන් ඇසුවාය.

"ඔව් ඔක්කොම"

"නැවේ කප්පිත්තා හරි මෝඩයෙක් වෙන්න ඇති. හොඳ කප්පිත්තෙක් කවදාවත් හැම දෙනාටම ගිලෙන්න හරින්නෙ නැහැ. අපි දැකලා තියෙනවා කැස්පියන් මුහුදෙ නැව් කිහිපයක් ගිලුණා. එකක දෙකක හැර අනෙක් හැම එකකදීම ඔක්කොම ගිලුනෙ නැහැ."

"නමුත් අපේ සෙමියනුයි ව්‍යාකීර් දෙන්නම ගිලුණා. ඒකෙන් පේන්නෙ ඔයා නරක කප්පිත්තෙක් බවද?"

මර්යුට්කා වේගයෙන් හුස්ම ගත්තාය.

"හ්ම් දැක්කද? එකට එක. හත්තිලව්වයි. හා හා කතාව කියමු."

"ප්‍රයිඩේ කතාවට එකතු වූ තැනදී ඈ කතාව නතර කරන ලෙස ඉල්ලුවාය."

"ඒකයි මේ මට ප්‍රයිඩේ කියන්නේ? හරියට ඔබ කෘසෝ වගේ. ඔබ කියන්නේ ප්‍රයිඩේ කළුයි? නීග්‍රොවෙක්? මා දැක්කා නීග්‍රෝවෙක්. ඇස්ට්‍රකාන් සර්කස් කණ්ඩායමකට ඇවිත් හිටියා."

මුහුදු කොල්ලකාරයන්ගේ පහරදීම් විස්තර කරන විට මර්යුට්කා විමතියෙන්, වේගයෙන් ඇසිපිල්ලන් හෙළන්නට වූවාය.

"දහදෙනෙක් එක්කෙනෙකුට? කැතයි නේද?"

අන්තිමේදී කතාව කෙළවර විය.

"ලෙප්ටිනන්ට් තුරුල්ලට වී සිටි මර්යුට්කා මොහොතක් නිහඬව සිටියාය.

"හරි ලස්සන කතාව! මා හිතනවා. ඔයා හුඟාක් කතා දන්නවා. මට හැමදාම කතාවක් කියන්නකෝ."

"ඔබ ඇත්ත වශයෙන් ඒ කතාවෙන් ප්‍රීති වුණාද?"

"ඔව් හරි හුඟක්. ඔබ මට හැම හැන්දෑවකම කතා කියනවා නේද? එහෙම කළොත් කාලය ගෙවෙන බව දැනෙන්නෙ නැහැ."

ලෙප්ටිනන්ට් ඇනුමක් හැරියේය.

"නිදිමතද"

"නැහැ. මට තාම ශක්තිය මදි."

"දුප්පත් කොල්ලා."

යළිත් මර්යුට්කා ඔහුගේ හිස පිරිමදින්නට වූවාය. ඔහු ඔහුගේ විශ්මයාකූල නෙත් මර්යුට්කා දෙසට හැරෙව්වේය. ඒ නෙත්වල ගැඹුරෙහි මෘදු ගතිය තැන්පත් වී තිබුණි. එතැනින් නික්මුණු ඒ ගතිය මර්යුට්කාගේ හද තුළට කා වැදුණි. උමතුවට පත් මර්යුට්කා ලෙප්ටිනන්ට් දෙසට නැඹුරු වී සිය උණුසුම් තොල් සඟල ඔහුගේ වැහැරී ගිය කම්මුලට තබා තදකර ගත්තාය.

හදවත සියලු නීති රීතීන් උල්ලංඝනය කරන නමුත් කෙනෙකුගේ පැවැත්ම කෙනෙකුගේ සවිඥානයේ උත්පාදකයා බව මෙයින් ඔප්පු වේ.

අරක්ෂක හමුදාවේ ලෙප්ටිනන්ට්, ගොවෙරුකා ඔට්ට්‍රොක් මර්යුට්කාගේ මරණ ලේඛනයේ 41 වැන්නා වීමට තිබුණි.

ඔහු ඇගේ විනෝදයේ පළමුවැන්නා විය.

ඔහුගේ මොළොක් අත්වලට, ඔහුගේ මෘදු කටහඬට ඈ ඇලුම් කළාය. ඒ සියල්ලටම වඩා ඇගේ සිත් ඇලී ගියේ ඔහුගේ අසමාන නෙත් යුවළ කෙරෙහිය.

මේ නීලවර්ණයෙන් ඇගේ සිතුවිලි ලෝකයට ආලෝකයක් ලැබුණි. ඇරල් මුහුදේ මළානික ගතියද නාසය කැඩී යන තරමේ ලුණු මාළු ගඳද ඈට දැනෙන්නේ නැත. සයුරෙන් එතෙර සෝෂාකාර ජීවිතයට යළිත් හවුල්වීමේ බලාපොරොත්තුව ඈ කෙරෙන් පියඹා ගියේය. දිවා කාලයේ ඈ ඇගේ කාර්යයන්හි නිරත වූවාය. ඈ පිළිණු පිටිවලින් රොටි පිළිස්සුවාය. මාළු තැම්බුවාය. ඇතැම් විටෙක රුවලක් පෙනේදැයි බැලීම සඳහා වෙරළට ගියාය.

සවස් භාගයේ, ඉර බහින වේලේ, කුඩා ඇඳ මත ලෙප්ටිනන්ට්ගේ තුරුල්ලට වෙන ඈ ඔහුගේ කතාවලට කන් යොමාගෙන සිටියාය.

ලෙප්ටිනන්ට් ඇට කතන්දර බොහෝ ගණනක් කියා දුන්නේය. ඔහු හොඳ කතන්දරකාරයෙකි.!

සාගරයේ දිය රැළි මෙන් මහත් බරකින්, ආයාසයකින් දවස් ගෙවී ගියේය.

එක්දිනෙක සිය කුඩා නවාතැන අසල අව්ව තපිමින් සිටි ලෙප්ටිනන්ට් ඒ අසල ලොකු මාළුවකුගේ කොර හරිමින් සිටි මර්යුට්කා දෙස දෙවුර හකුලුවා ඇස් කුඩාකර බැලුවේය.

"හ්ම් මොන මළ කුණුද?"

"මොනවද සුදු"

"කුණු මං කීවේ, ජීවිතය කුණු ගොඩක්, මූලික කල්පනාවලින් අදහස් පහළ වෙනවා - චාටු ගොඩක්. චිරාගත ලකුණු හරියට භූගෝල සිතියමක පෙනෙන ලකුණු වගෙයි. ආරක්ෂක හමුදාවේ ලෙප්ටිනන්ට්? අරක්ෂක හමුදාවේ ලෙප්ටිනන්ලාට හෙණගහල ගියදෙන්. මට ඕනෑ ජීවත්වෙන්න. මා අවුරුදු විසිහතක් ජීවත් වුණා. නමුත් මා තාම ජීවත් වුණේ නැහැ. මා විශාල මුදල් ගොඩක් කාලා කිසියම් ධර්මයක් සොයමින් රටින් රට ගියා. එහෙත් හැම තැනකදීම මට හමුවූයේ මාගේ ධෛර්ය උරාගත් හිස් බව පමණයි. මගේ ඉතාම තේරුමක් ඇති කාලය මේ කැවුම් පෙත්තක් වගේ දිවයිනේ ගතකරන්නට සිදුවේ යැයි ඒ කාලයේ කිසිවකු කීවේ නම් මා විශ්වාස කරන්නේ නැහැ."

"ඒ මොකක්ද? මොන විදියේ දවස් ගැනද ඔබ කීවේ."

"ඉතාම තේරුමක් තිබෙන දවස්, ඔබට තේරුණාද? ඔබට තේරුම් යන විදියට මා කෙසේ කියන්නද? මේ ලෝකයට මා අයත් නැති කෙනකු ලෙස, තනියම දඟලන කෙනකු ලෙස කල් ගත කළ දවස්, එහෙත් මේ සියල්ල තුළින් මා හැදුණා."

ඔහු වැලි දෝතක් දෑතට ගත්තේය.

"මේ සියල්ලෙන් මා වෙන් නොකළ හැකි කොටසක් බව දැන් දැනෙනවා. මේවායේ හුස්ම මගේ හුස්මයි."

නිදසුනක් වශයෙන් මූදු රැල්ලේ හුස්ම, ඇහුණද? ස්වූස්, ස්වූස්, එය මුහුදේ හුස්ම නොවේ. එය මගේ මගේ ආත්මය සහ ශරීරය."

මර්යුට්කා ඈ අතේ තිබුණු පිහිය බිම තැබුවාය.

"මහ බරපතළ වචන, මට ඕනෑ වචන සියල්ල මාදන්නෙ නැහැ. මා නිකම්ම කියන්නම් මා නම් මෙහි ඉන්නෙ හරි ප්‍රීතියෙන්."

"වචන වෙනස් වුවත් තේරුම් සමානයි. දැන්නම් මේ පුදුම දිවයින අත්හැර යන්නට මා නම් කැමැති නැහැ. මගේ එකම කල්පනාව, මේ සුන්දර දිවයිනේ අව්වට වියළෙමින් උණුසුම උරා ගනිමින් සකලවිධ ධනයෙන් තෘප්තියට පත් සත්වයකු ලෙස සදාකාලයටම වාසය කිරීමයි."

මතක නැතිව ගිය කිසිවක් මතක් කරන්නාක් මෙන් මර්යුට්කා බිම බලා ගත්තාය. අනතුරුව ඈ කාරුණික වරදකාරී බැල්මක් හෙළුවාය.

"කෙහෙල්මල! මට නම් මෙහි ඉන්න බැහැ. බොහොම ලෙහෙසි වැඩක්. කෙනෙකු මොළොක් කරන එක. ප්‍රීතියෙන් සිටින බව පෙන්වන්නවත් මෙහි කිසිවෙක් නැහැ. මළ මාළු මිසක් වෙන කිසිත් නැහැ. අනේ මාළුකාරයන් ඉක්මනින් ආවොත්! මාර්තු ඉවර වෙන්න දැන් ළඟ ඇති මිනිසුන් දකින්න නැතිව මා ලෙඩින්."

"අපි ජීවත්වෙන අය නොවේද?"

"ඔව් තාමත් අපි ජීවත් වෙනවා. නමුත් තව සුමානෙකින් අර පිටි බින්දුවත් ඉවර වී ගියාම වැඩේ කොහොමද? ඒ විතරක් නොවේ. මේ කාලය ලිප ළඟට වී උණුසුමෙන් ඉන්න කාලය නොවෙයි. අපේ මිනිස්සු එහේ ලේ හලමින් සටන් කරනවා. සෑම කෙනෙක්ම ඕනෑ වෙලාව. මේ වගේ වේලාවක ප්‍රීතිවන්නේ කොහොමද? මා හමුදාවට දිව්රුවේ මෙහෙම ඉන්න නොවෙයි."

ලෙප්ටිනන්ට්ගේ ඇස් පුදුමයෙන් පියවිණි.

"ඔබගේ බලාපොරොත්තුව යළිත් හමුදාවට යන්නද?"

"නැත්නම් වෙන මොකක්ද?"

උළුවස්සේ ලීයෙන් ගළවාගත් පතුරු කැබැල්ලක් අතේ තබාගෙන සිටි ලෙප්ටිනන්ට් ජල ප්‍රවාහයක් සේ කතා කරන්නට විය.

"මෝඩ කෙල්ල, මර්යුට්කා මා ඔබට කියන්නට සිටියේ මේ ලේ හැලීම් දැන් නම් මට තිත්ත වෙලා. වෛරයෙන්, යුද්ධයෙන් අවුරුදු කීයක් අප දැන් ගත කර තිබෙනවාද? මා උන් සොල්දාදුවෙක් නොවේ. එක් කලෙක මා මනුෂ්‍යයකු විසින් ගත කළ යුතු අන්දමේ උසස් කොටසකින් ජීවත් වුණා. ජර්මනියත් එක්ක යුද්ධයට පෙර මා වාග් විද්‍යාව ඉගෙනීමේ යෙදී සිටියා. එකල මා ජීවත් වුණේ පොත් සමග. පොත් කවදාවත් කෙනෙකු පාවා දෙන්නෙ නැහැ. මා ළඟ පොත් විශාල ගණනක් තිබුණා. මගේ කාමරේ බිත්ති තුනක්ම බිම සිට සීලිම දක්වා පොත් රාක්කවලින් පිරිලා. මට මතකයි සැන්ට් පීටර්ස්බර්ග් නගරය. මිහිදුම් පටලයෙන් වැසී ගිය සවස් භාගයක මා මගේ කාමරයේ හාන්සි පුටුවේ හිඳගෙන සිටි හැටි. දැන් වගේම ඒ කාලයෙත් මා වැඩි සැලකිල්ලක් නොදක්වන ස්වාධීන කෙනෙක්. එයින් මගේ ආත්මයේ පිපුන මල් - ඒ මල් ලෙළෙන ශබ්දය කෙනකුට ඇසෙන්න පුළුවනි හරියට වසන්තයේ කොට්ටම්බා ගස්වල මල් වගේ. ඔබට තේරෙනවාද?"

'හ්ම්' මර්යුට්කා හූමිටි තැබුවාය.

"එක්තරා දවසක ඒ සියල්ල පුපුරා විනාශ වී කැබලිවලට ගියා. ඒ දිනය ඊයේ වගේ මට මතකයි. එදා මා හිටියේ අපේ පිටිසර ගෙදර ඉස්තෝප්පුවේ, පොතක් කියවමින් මට ඒකත් මතකයි. එදා හිරු බසින විට තද රත් පැහැයක් පැතිර ගියා. ලේ පාට වර්ණයෙන් අවට නැහැවී ගියා. මගේ පියා නගරයේ සිට දුම්රියෙන් ආවා. පුවත්පතක් බලමින් සිටි ඔහු කරදරයෙන් ලතවෙන බව පෙනුණා. ඔහු එක වචනයක් කීවා. එහෙත් ඒ වචනයේ මාරාන්තික බවක් ගැබ් වී තිබුණා. යුද්ධය, මළහිරේ පාට මෙන් රක්තවර්ණ වූ භයානක වචනය, ඉන්පසු ඔහු මෙසේ කීවා." 'වාඩිම් උඹේ පියා, උඹේ සීයා, උඹේ ආතා, මේ හැම කෙනෙක්ම රට වෙනුවෙන් පළමුවැනි නිවේදනය කළ විගසම ඉදිරිපත් වුණා. මා බලාපොරොත්තු වෙනවා වාඩිම්..." ඔහුගේ බලාපොරොත්තුව කඩවුණේ නැහැ. මා මගේ පොත් අත්හැරියා - මා කරන්නේ නිවැරදි දෙයක් යැයි සිතමින් ඒවායින් ඉවත් වුණා."

"පිස්සු! මගේ පියා බීමත්ව ඔළුව පොළොවේ ගසාගත්තත්

ඔබ හිතනවද මා නම් එය කරයි කියා? මට නම් පේන්නෙ නැහැ. දෙවුර හකුලාගත් මර්යුට්කා ඇසුවාය.

ලෙප්ටිනන්ට් දිග සුසුමක් හෙළුවේය.

"ඔබට පෙනීයනවා යැයි හිතන්න බැහැ. ඔබට උතුම් පරම්පරාවක් ගෙන යන්න බැහැ. පවුලේ ගෞරවය ඒක කෙනෙකුගේ යුතුකම. ඒ ගැන අපේ ලොකු හැඟීමක් තියෙනවා."

"ඉතින් ඒකට මොකද? මා මගේ පියාට ආදරෙයි. ඒ වුණාට මෝඩකමක් කරන්නට කීවොත් මා කරන්නෙ නැහැ. ඔබට බැහැ කියන්න තිබුණා."

ලෙප්ටිනන්ට් වංක අමිහිරි සිනාවක් පෑවේය.

"මා යුද්ධයට පිටත් වුණා. එහිදී මගේ අතින් ම ඒ ලෝකය නමැති සොහොන් බිමේ, ඒ කුණු වී ගිය ජරා ගොඩෙහි මගේ මානුෂික හදවත වළලා දැම්මා. ඊට පස්සෙ විප්ලවය ආවා. මා ප්‍රීතියට පත් වූවා. මා ඒ කෙරෙහි විශාල බලාපොරොත්තු ඇති කර ගත්තා. එහෙත් එය.. මේ බලන්න සාර් හමුදාවේ නිලධාරියෙක් වශයෙන් සිටි අවුරුදු කිහිපය තුළදී කිසිම දිනෙක මාගේ යටතේ සිටි සොල්දාදුවෙකුට මා දඬුවමක් දුන්නේ නැහැ. ඒත් නොමෙල් දුම්රියපොළේ දී මා අල්ලා ගත් රතු හමුදා භටයෝ මගේ පටි ගළවා ගෙන මගේ මුහුණට කෙළ ගැසුවා. ඇයි?... මා යුරල් කඳුකරයට ගෙන ගියා. මට තාමත් මගේ රට ගැන විශ්වාසයක් තිබුණා. තවත් වරක ඈ වෙනුවෙන් සටන් කරන්නට මා පටන් ගත්තා. නින්දාවට ලක් කළ මගේ උරයේ පටි සඳහා මා සටන් කරන්නට පටන් ගත්තා. මා සටන් කළ තරමට මට පෙනී ගියා තවදුරටත් මගේ රටක් නැති බව, උරිස් පටි සටන් කරන්නට තරම් වටිනා දෙයක් නොවේ. සදාකාලික එකම දේ මට මතකයි. කල්පනාව, හැඟීම් මට මතක් වුණා. දැන් මට උවමනා එකම දේ ඒ පොත්වලට යළි ළංවීමයි. ඔවුන්ගෙන් සමාව ලබාගෙන ඔවුන් සමග ජීවිතය ආරම්භ කරන්නයි."

"එහෙනම් ඒකත් එහෙමයි, ලෝකය දෙකට කැඩී ගෙන යයි. මහජනයා ලේ ගළමින් යුක්තිය සඳහා සටන් කරනවා. ඔබට ඕනෑ ඇඳට වී පොත් කියවන්න.?"

"මා දන්නෙ නැහැ... මට දැනගන්න ඕනෑකමකුත් නැහැ." කපිතන් උමතුවෙන් මෙන් කීය. "එකම දේ මා දන්නේ ලෝකය අවසානයට එන බවයි. ලෝකය දෙකට කැඩී ගෙන එන බව ඔබ කීවා හරි. ලෝකය දෙකට පුපුරනවා! ලෝකය කුණුවෙලා පතුරු හැළෙනවා. එය පතුරු ගැහිලා හිස් බවෙන් එය විනාශ වී යනවා. එය සොයා නොගත් රටවලින් තරුණ භටයන්, පෝෂණයෙන් සැඟවුණු වස්තුවෙන් පොහොසත්ව තිබුණා. ඒවා දැන් සියල්ල ඉවරයි. දැන් සොයාගන්න අලුත් දෙයක් නැහැ. දැන් මොළයේ තිබෙන සියලු තියුණු බුද්ධිය පවතින දේ රැකගැනීම සඳහා යොදවනවා. ජීවය තව ශත වර්ෂයකට, තව අවුරුද්දකට, තව සතියකට දිග් ගස්සා ගන්න යොදනවා. යන්ත්‍ර සූත්‍ර ජීවයක් නැති ගණිත විද්‍යාව, ගණිත විද්‍යාවෙන් කල්පනාව ඇති වෙනවා. කල්පනාව සම්පූර්ණයෙන් එල්ල වන්නේ මනුෂ්‍ය සංහතිය විනාශ කිරීමට. මනුෂ්‍යයන් මරණ තරමට අපේ බඩවල්, සාක්කු තරවෙනවා. මේ මළ විකාර! මට ඕනෑ නැහැ. කාගේවත් අදහස් අහන්න. මට ඕනෑ මගේ අදහස් ඇති. මට තවත් ටිකක් අත්වල ලේ තවරා ගන්න ඕනෑ නැහැ.!"

"ඔබේ ලස්සන සුදු අත්! ඔබේ මැදපු කරපටි! වෙනත් අය ඔබට භාරදෙන තුරු නිකම් බලා ඉන්ට තරම් ඔබේ හදවත ලොකුයි!"

"ඔහේ හාරපුවාවේ. යකාට ගියදෙන්! අප මෙතනින් බේරාගත් විගස කොකේසස් කඳුකරයට යමු. මර්යුටිකා සුචි නගරය අසල මා සතු ඉඩමක් තිබෙනවා. එතැනට තමා අප යන්නේ. ලෝකය යකාට ගියදෙන්, මා පොත් සමග ජීවත් වෙනවා. මට ඕනෑ සාමය හා නිහැඬියාව. යුක්තියක් මට ඕනෑ නැහැ. මට සාමය ඕනෑ ඔබට ඉගෙනගන්න පුළුවනි. ඔයාට ඉගෙන ගන්න ඕනෑ කියල? මෙන්න ඔබගේ අවස්ථාව. ඔබට අවශ්‍ය සියල්ල මම සපයන්නම්. ඔබ මගේ ජීවිතය බේරා ගත්තා. මා එය කවදාවත් අමතක කරන්නෙ නැහැ.

මර්යුටිකා නැගිට්ටාය. "එහෙනම් ඔබ මගෙන් බලාපොරොත්තු වන්නේ ඒකයි. මිනිස්සු යුක්තිය සඳහා ඔවුන්ගේ ජීව රුධිරය හළමින් සටන් කරනකම් ඔබ ළඟ මෙට්ටයක් උඩ

හාන්සි වී ඉන්න? වෙනත් නෙකකුගේ ජීව රුධිරයෙන් මිලට ගන්නා චොක්ලට්වලින් මගේ බඩ පුරවන්න? ඒකද ඕනෑ කරන්නෙ?"

"එන්න එන්න ඇයි ඔය තරම් ගොරෝසු?"

තිගැස්සුණු ලෙප්ටිනන්ට් ඇසුවේය.

"ගොරෝසුව? ඔබට ඕනෑ හැම දෙයක්ම හොඳ සනීපෙට? ඔබට බෝල්ෂෙවික් සත්‍යය ගැන දැන ගන්නට ඕනෑ නැහැ. ඔබට ඒවා ඕනෑ නැතැයි ඔබ කීවා. ඔබ ඒ ගැන දන්නෙත් නැහැ. කවදාවත් දැන ගත්තෙත් නැහැ. එය ඩාබිඳුවෙන් ඩාබිඳුවට, කඳුළෙන් නෑවෙමින් ඉදිරියට එන හැටි දැන ගන්නට ඔබට ඕනෑ නැහැ!"

"නැහැ මං දන්නෙ නැහැ. නමුත් මට පුදුමයි ඔබ වැනි කෙල්ලක් ඔතරම් ගොරෝසුවීම."

මර්යුට්කා සිය දෙඅත් ඉඟටිය වෙත රඳවා ගත්තාය.

"ඔබගේ අදහස්වලට එකඟවීම දැන් මට මහා ලැජ්ජාවක්! පණුවා! පිට කොන්දක් නැති යකා! මෙහේ එන්න මෙහාට ඇඳට වී ඔබයි මමයි නැළවෙමු. ඈ ඔලොක්කම් කරන්නට වූවාය.

වෙනත් මිනිස්සු නව ලෝකයක් බිහිකරන්නට දවස දෙවේලේ මහන්සි වෙනවා. ඔබ...? හ්ම් උඹ බැල්ලිගේ පුතෙක්!

ලෙප්ටිනන්ට්ගේ මුහුණ රතු විය. දෙතොල් තද විය.

"ඔබට ඔබ ගැන අමතක වේගෙන එනවා."

අඩියක් ඉදිරියට තැබූ මර්යුට්කා මුළු වෙර යොදා ලෙප්ටිනන්ට්ගේ කම්මුලට පහරක් ගැසුවා ය.

අත මිට මොළවාගත් ඔහු ගැහෙන්නට විය.

"ඔබ ගැහැනියක් වීම ඔබේ වාසනාව!" ඔහු පිඹින්නට විය.

ඔහු නවාතැන තුළට ගියේය.

මර්යුට්කා සිය අපිරිසිදු අත් දෙක බැලුවාය.

"ඒ මහත්මයා නේද... හත්ඉලව්වයි!

ලෝක විනාශයේ මහා හඬ ලෙප්ටිනන්ට් ගොවිරුකා ඕට්‍රොක්ගේ දෙසවන පතිත වූ අතර කර්තෘ සිය කතාව අවසාන කිරීමේ වගකීමෙන් ගැලවෙන්නේය.

දවස් තුනක් තිස්සේ ලෙප්ටිනන්ට් හා මර්යුට්කා අතර කතා බහක් නොවීය.

එහෙත් ජනශූන්‍ය දිවයිනක වාසය කරන දෙදෙනෙකුට ඔවුනොවුන් වළක්වාලමින් ජීවත් වීම අසීරු කරුණකි.

වසන්ත සමය උදා විය. එය හදිසියේම පැමිණියාක් වැනිය. දිවයින වසා තිබුණු අයිස් තට්ටුව කෙමෙන් දියවන්නට වී වෙරළ කහ පැහැයක් ගත් අතර සමුද්‍රය තද නිල් වර්ණයකට පරිවර්තනය විය.

දවල් කාලයේ වැල්ල උණුසුම්ය.

උණුසුම් සුළඟින් ඔප වැටුණු සූර්යයා දැවැන්ත රෝදයක් මෙන් අහසේ පෙරළී ගියේය.

දිවයිනේ වසන දෙදෙනා සූර්ය තාපයෙන්, උණුසුම් වාතයෙන් හා එළවළු නොකෑමෙන් හටගන්නා රෝගයකින්ද පෙළෙන්නට වූහ.

මේ වූ කලී දබර කරන අවස්ථාවක් නොවේ.

උදේ සිට සවස් වන තුරු වැල්ලේ හාන්සි වී සිටින ඔවුහු යාත්‍රාවක රුවලක් දකින බලාපොරොත්තුවෙන් නීල ජල කඳ දෙස සිය ඇස් යොමුකර ගෙන සිටිති.

“මට නම් තවත් ඉවසන්න බැහැ! තව තුන් දිනකින් මසුන්

මරණ අය නාවොත් මා වෙඩිතියා ගන්නවා." නොඉවසිලිවත් වූ මර්යුට්කා උමතුවෙන් මෙන් පළ කළාය.

ලෙප්ටිනන්ට් සියුම් හඬකින් උරුහම් බෑවේය.

"මා හිතුවේ මටයි පිටකොන්ද නැත්තේ කියා. ඉවසන්න, මර්යුට්කා, ඔබට පුළුවනි නායකයෙක් වෙන්න. ඔබ හොඳ ඒකට පමණයි. හොරු කණ්ඩායමක නායකයකු වෙන්න."

"ආයෙත් පටන් ගන්න ඕනෑ. මොකද? ගිය දේ යන්න හරින්න බැරිද? ඇත්ත. මට තරහ ගියා. නමුත් ඊට හොඳ හේතුවක් තිබුණා. ඔබ නරියකු බව දැනගන්නට ලැබීම හිත් රිදවන කරුණක්. වේදනාවක්. ඔබ මගේ හදවත තුළට කා වැදුණේ මගේම විනාසෙ!"

උඩුබැලි අතට වැල්ලේ වැතුරුණු ලෙප්ටිනන්ට් දෙකකුල් උඩට ඔසවමින් සිනාසෙන්නට විය.

"මොකද? ඔබට පිස්සුද?

ලෙප්ටිනන්ට් තාමත් සිනාසෙයි.

"ඒයි මොළේ ඉදිමිලා? උත්තර දෙන්න කට නැද්ද?"

මර්යුට්කා ලෙප්ටින්ට්ගේ ළපැත්තට අතින් ගසන තුරු ඔහු කතා කළේ නැත.

අනතුරුව වැල්ලෙන් නැගිට්ට ඔහු සිය දෙනෙතෙහි වූ කඳුළු පිසදැම්මේය.

"ඔබ ගොරවන්නේ මොකටද?"

"මාරියා පිලටොව්නා, ඔබ දුෂ්කර වර්ගයකට අයත් සත්වයෙක්! ඔබට පුළුවනි ඕනෑම කෙනකු ප්‍රීතිමත් කරන්න. ඔබට පුළුවනි මළ මිනී නටවන්න."

"ඇයි බැරි? එක පැත්තකටවත් නොවැටී දිය සුළියකට අසු වූ ලී කැබැල්ලක් වගේ තමන් ක්ලාන්ත වෙන අතර බලා සිටින අය පිළිකුලට පත්කරන එකද හොඳ?"

යළිත් සිනාසෙන්නට වූ ලෙප්ටිනන්ට් මර්යුට්කාගේ පිටට තට්ටු කළේය.

"කාන්තා ලෝකයේ නායිකාව! සියලු ජයග්‍රහණයන් ඔබ තමා! මගේ අප්‍රමාණ ප්‍රයිඩේ! ඔබ මා වෙනුවෙන් ලෝකය අනෙක් පැත්තට පෙරලුවා. ඔබ මගේ නහර තුළට ජීවයේ අමෘතය විද්දා! මට තව දුරටත් දිය සුළියක ලී කැබැල්ලක් වෙන්න ඕනෑ නැහැ. මගේ පොත් කරා යන්නට තාම කල්වේලා වැඩියි. පළමුවෙන් තව තවත් ජීවිතය පිළිබඳ කරුණු දැකගන්නට ඕනෑ. මගේ දත් තියා ගන්න ඕනෑ. දිවියෙක් වගේ කන්න ඕනෑ."

"මොනවා? ඔබ ප්‍රකෘති සිහියෙන්ද කතා කරන්නේ?"

"මට නම් සිහිය තියෙනවා කෙල්ලේ! මට සිහිය ලැබිලා එකක් දෙකක් ඉගැන්වීම ගැන ස්තුතියි. මේ වගේ අවස්ථාවක අපි පොත් තුළට වී මේ පරණ ලෝකයේ ඔබ කැමැති දෙයක් කරන්නට ඉඩ හැරියොත් බරපතළ වියදමක් දරන්න වේවි. නැහැ. කෙල්ලෙ තාම..."

"ඔහු දිග හුස්මත් ගත්තේය."

ඔහුගේ ඇති නීල වර්ණ ඇස් ඈත ක්ෂිතජය වෙත එල්ල වී තිබුණි. ඒ තුළ ප්‍රීතිය නටන්නට විය.

ඈත මුහුදට අත දිගු කළ ඔහු, හෙමින් ගැහෙන හඬකින් 'රුවලක්' යැයි කීය.

දුන්නක් දිග ඇරුණාක් මෙන් නැගිටගත් මර්යුට්කා, ඔහුගේ ඇඟිල්ල එල්ල කළ දිසාව බැලුවාය. සුළඟින් ලෙලෙන රුවලක් ඈ නෙත වැකුණි.

කාලයක් තිස්සේ බලා හුන් මේ නිමිත්ත සත්‍යයක් දැයි අදහා ගැනීමට අපොහොසත් වූ මර්යුට්කා සිය දෙඅත් ළය මත තබාගෙන සුසුමක් හෙළුවාය.

ප්‍රීතියෙන් නැගිටගත් ලෙප්ටිනන්ට් ඇගේ දෙඅත් ගෙන ඈ සමග නටන්නට විය.

ගීයක් ගයමින් කෙට්ටු කකුල් විහිදුවමින් ඔහු නැටුවේය.

'සුදු එළියයි, තනි රුවලයි

පාවේ නිල් මූදේ!

ට්‍රාලා-ලා ට්‍රා ලා ලා

පීඩල් ඩී - පීඩල් ඩී ඩී.'

"මෝඩයා ඔය ඇති" මර්යුට්කා කීවාය.

"මර්යුට්කා, මගේ කෙල්ලෙ, මගේ ගැහැනු නායිකාව, අපි ගැලවුණා! අපි ගැලවුණා!

"පේනවා නේද? මනුෂ්‍ය වාසයට යන්නට ඔබ තුළ තිබෙන ආසාව."

"ඔව්! ඔව්! මා ඔබ කීවා!"

"හිටින්න. ඔවුන්ට දන්වන්න ඕනෑ. ඔවුන්ට සංඥා කරන්න ඕනෑ."

"ඇයි? ඒ නැව එන්නෙ මෙහාට."

"ඔවුන් දූපතකට ගියොත්? දූපත් ලක්ෂ ගණනක් තිබෙනවා. රයිපලයක් ගේන්න."

නවාතැන බලා දිව ගිය ලෙප්ටිනන්ට් මොහොතකින් රයිපලයක් උඩ දමමින් සෙල්ලම් කරමින් දිවගෙන ආවේය.

"ඕක එක්ක සෙල්ලම් හොඳ නැහැ. උඩට වෙඩි තුනක් තියන්න!"

තුවක්කුව ගත් ලෙප්ටිනන්ට් වෙඩි තුනක් තැබුවේය. මෙතෙක් රජ කළ නිහැඬියාව ඉන් බිඳී ගිය අතර තුන් වතාවේම ඔහු වැටෙන්නට ගියේය. තමා කොතරම් දුර්වල දැයි ඔහු වටහා ගත්තේ එවිටය.

දැන් රුවල හොඳට පෙනේ. සුබ ලකුණක් රැගෙන එන පක්ෂියකුගේ පියාපත් සේ දඹ පැහැති ඒ රුවල වතුර උඩින් ලිස්සමින් ඔවුන් වෙත ළංවන්නට විය.

"එය මොන අන්දමේ යාත්‍රාවක්ද? මසුන් මරන ඔරුවකට වඩා ලොකුයි!"

මර්යුට්කා කොඳුරන්නට වූවාය.

යාත්‍රාවේ සිටි අයට වෙඩි හඬ ඇසුණි. යාත්‍රාව කෙළින්ම දිවයින කරා ඇදෙන්නට විය.

"ධීවර පරීක්ෂකයකුට හෝ වෙන නිලධාරියකුට අයිති යාත්‍රාවක් වෙන්න ඇති. නමුත් මේ කාලේ මෙහෙ කොහි යනවද?"

මර්යුට්කා ඇසුවාය.

වෙරළට යාර දෙසීයක් පමණ ළං වූ යාත්‍රාවේ මිනිසකුගේ ස්වරූපයක් පෙනෙන්නට විය. දෑත් මුව වටා තබාගත් ඔහු ඔවුන්ට කතා කළේය.

රයිපලය බිම දැමූ ලෙප්ටිනන්ට් වතුරට බැස්සේය. අත් විදහාලූ ඔහු ප්‍රීතියෙන් කෑගසන්නට විය.

"හුරේ, අපේ මිනිස්සු. ඉක්මන් කරපල්ලා!"

ඉතා විමසිල්ලෙන් යාත්‍රාව දෙස බලා සිටි මර්යුට්කා යාත්‍රාවේ සිටි තැනැත්තාගේ උරිස් මත තිබුණු දිලිසෙන පිත්තල පටි දුටුවා ය.

ඈ කිරිල්ලියක මෙන් භීතියට පත්වූවාය.

ඇයට හුරු පුරුදු චිත්‍රයක් මනසෙහි පහළ විය.

අයිස්... නිල් ජලය... යෙව්සුකොප්ගේ මුහුණ. ඔහුගේ වචන: "සුද්දන්ගේ අතට අසුවුණොත් ඔහුට පණපිටින්. යන්න දෙන්න එපා."

දිග හුස්මක් ගත් ඈ රයිපලය අතට ගත්තාය.

"හත්තිලව්වයි, ආපසු එනවා" ඈ වියරුවෙන් කෑ ගැසුවාය.

"ආපසු එනවා!"

ලෙප්ටිනන්ට් දෙඅත් වනමින් යාත්‍රාව කරා යන්නට විය.

හදිසියේම ඔහු පිටුපසින් ගින්නෙන් හා ජල ප්‍රවාහයෙන් විනාශ වූ ලෝකයක හඬ නිකුත් විය. විපතින් වළකිනු සඳහා ඔහු පැත්තකට පැන්නේය. ඔහු අවසානවරට ශ්‍රවණය කළේ මිය යන ලෝකයක ප්‍රචණ්ඩ හඬය.

මර්යුට්කා ඔහු දෙස බැලුවේය.

රයිපලය බිම දැමූ ලෙප්ටිනන්ට් වතුරට බැස්සේය.
අත් විදහාලූ ඔහු ප්‍රීතියෙන් කෑගසන්නට විය.

ඔහුගේ ඔළුව වතුරේ වැටී තිබුණි. ඔහුගේ හිස දෙබෑවීමෙන් නිකුත් වූ රුධිරය හෙමිහිට වතුරට මිශ්‍ර වෙමින් තිබිණ.

"අයියෝ මා කළේ මොකක්ද? මා දෙස බලන්න! ඔබේ ඔය නිල් ඇස් මා දෙසට හරවන්න!"

ඉදිරියට දිවගිය ඈ ඔහු අසල දණින් වැටුණාය. රයිපලය විසි කළ ඈ සිය කබාය ඉරා, හිස වත්තන් කර ගැනීමට උත්සාහ කළාය. හදිසියේම ඈ විසඥව මළ සිරුර මත ඇද වැටුණාය.

එවිටම යාත්‍රාව වෙරළට සේන්දු විය. දියේ වැටී සිටි මිනිසා සහ තරුණිය දුටු යාත්‍රාවේ සිටි අය ගල් ගැසී බලා උන්හ.

බොරිස් ලැවරෙන්යොව්

හතළිස් එක්වැන්නා

අනුවාදය
දැදිගම වී. රුදිගු

මර්යුටිකා නමැති සෙබළියකගේ චරිතය ප්‍රධාන චරිතය කොට ගනිමින් ලියැවී ඇති 'හතළිස් එක්වැන්නා' යුද්ධයෙහි ඇති බිහිසුණු බවත් නිසර බවත් මැනවින් නිරූපණය කරන අතරම විපතේදී මිනිස් සිත් ක්‍රියා කරනු ලබන අපූර්වත්වය කදිමට ගෙන හැර පාන්නකි.

ස්ත්‍රියක ලෙස සෙබළ කණ්ඩායමක් සමග සතුරන්ගෙන් බේරී පලා යාමේදී ඇය අත්විඳින මනෝභාවයන් මෙතරම් කදිමට නිරූපණය වූ අන් තැනක් රුසියානු සාහිත්‍යයෙහි වුවද නැති තරම් යයි මිනොස්කොව් නමැති රුසියානු විචාරකයා සඳහන් කළේය.

ISBN 978-955-0983-37-3

සමිර පොතක්

සමිර ප්‍රකාශන
අංක 12, පොල්දූව, බත්තරමුල්ල
දුරකථන : 0112868249

9 789553 993373

Cover Design by H. Pradeep Darshana, Ragama. Tel : 0772876280

මිල රු. 275/-